ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

ஊக்குப் பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான இலங்கை முகவராண்மை

Sri Lanka Anti-Doping Agency

SLADA

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

கிராமிய மற்றும் பாடசாலை விளையாட்டு உட்கட்டமைப்பு மேம்பாட்டு இராஜாங்க அமைச்சு

State Ministry of Rural and School Sports Infrastructure Improvement

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report

# 2021

# ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

# වාර්ෂික වාර්තාව 2021

## සිංහල අනුවාදය

# පටුන


1 ආයතනික තොරතුරු ........ 1-2

2 අපගේ දැක්ම, මෙහෙවර සහ අරමුණු ........ 3-4

3 වැදගත් සංඛ්‍යාන ........ 5

4 ප්‍රධාන කාර්ය සාධන සාරාංශය ........ 6

5 සභාපතිතුමාගේ පණිවුඩය ........ 7-8

6 අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය ........ 9-10

7 අධ්‍යක්ෂ මණ්ඩලය ........ 11

8 අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව ........ 12-13

9 ආයතන ව්‍යුහය සහ කාර්ය මණ්ඩල තොරතුරු ........ 14-15

10 මෙහෙයුම් ප්‍රගතිය

- අධ්‍යාපන හා පරීක්ෂණ අංශය ........ 17-22
- නීති අංශය ........ 23
- බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම් අංශය ........ 24-26
- පර්යේෂණ අංශය ........ 27-31
- තොරතුරු තාක්ෂණ අංශය ........ 32-34
- පරිපාලන අංශය ........ 35

11 තිරසාරභාවය පිළිබඳ වාර්තාව ........ 36-38

12 ආයතනික පාලනය ........ 39-40

13 අවධානම් කළමනාකරණ වාර්තාව ........ 41-42

14 විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව ........ 43-44

15 මූල්‍ය වාර්තාව ........ 45-57

16 ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව ........ 58-64

17 කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග ........ 65-67

# ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

මානවයා ක්‍රම ක්‍රමයෙන් පරිණාමය වෙමින් සමාජගත වීමට වෙර දරන අවධියක තම ජීවන අවශ්‍යතා ඉටුකර ගැනිමට යෑමේ දි පරිසරය හා සතා සිව්පාවා සමඟ ගැටීමේ අතුරු ඵලයක් ලෙස ක්‍රීඩාව ඉස්මතු විය. පසු කාලීන ව මෙම සංකල්පය විනෝදාංශයක් වශයෙන් වර්ධනය වී වර්තමානය වන විට ක්‍රීඩා සංකල්පයක් ලෙස දියුණු මට්ටමකට සංවර්ධනය වී වෘත්තීයමය හා වාණිජමය මුහුණුවරක් ගනිමින් සිටී.

එහි ප්‍රතිඵලයක් ලෙස වර්තමාන ක්‍රීඩක/ක්‍රීඩිකාවන් හුදෙක් ම ජයග්‍රහණය පසුපස හඹා යෑමට පෙළඹෙන නිසා එහි අතුරු ඵලයක් ලෙස ක්‍රීඩාවේ දී භාවිතා නොකළ යුතු තහනම් ද්‍රව්‍ය කරලියට පැමිණ තිබේ.

ජාතික මෙන් ම ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ වලදී මෙම තහනම් ද්‍රව්‍ය භාවිතය තුළින් ක්‍රීඩාවේ අව්‍යාජ භාවයට හානි සිදුකරනවා සේ ම අවසානයේ රටක් ලෙස ජාත්‍යන්තරය ඉදිරියේ අපකීර්තියට පත් ව ජව සම්පන්න රටේ මතු පරපුර සෞඛ්‍ය අතින් පරිහානියට ද පත්වේ.

ජාත්‍යන්තර මට්ටමෙන් තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම සඳහා 1999 සිට කැනඩාවේ මොන්ට්‍රියෙල් නුවර කේන්ද්‍ර කොටගෙන ක්‍රියාත්මක වන ලෝක තහනම් උත්තේජක මර්දන ආයතනය අනුගමනය කරමින් 2013 වසර තෙක් ම ශ්‍රී ලාංකික ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම සහ, ඒ පිළිබඳ ව නිරූපණය කිරීම් සිදු කිරීම ක්‍රීඩා වෛද්‍ය ආයතනය මගින් සිදුවිය.

මෙම විෂය ඉටුකිරීම සඳහා ස්වාධීන කටයුතු කරන වෙනම ම ආයතනයක අවශ්‍යතාවය ඒ වන විටත් මතුවෙමින් තිබුණ බැවින් 2013 වර්ෂයේ නොවැම්බර් 10 වැනි දින දී "2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදිමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත" සංස්ථාපනය කෙරුණි. එම පනතෙහි තුන්වන කොටස යටතේ තහනම් ද්‍රව්‍ය හා ක්‍රම ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවෙන් මුලිනුපුටා දැමීම වන විෂය තේමා කරගත් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නමින් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බිහි කරනු ලැබිය.

දැනට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස කටයුතු කරයි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ ක්‍රීඩික ක්‍රීඩිකාවන් ක්‍රීඩාවේදී භාවිතා නොකළ යුතු තහනම් උත්තේජක මුලිනුපුටා දැමීම හා යහපත් පිරිසිදු භාවයෙන් යුතු ක්‍රීඩාවක් ප්‍රවර්ධනය කිරීමයි.



# ආයතනික තොරතුරු

## ආයතනයේ නම

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

## නෛතික ස්වරූපය

2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ තුන්වන කොටස යටතේ මෙම ආයතනය පිහිටුවා ඇත.

## ආරම්භක දිනය

2013 වර්ෂයේ නොවැම්බර් 10 වැනි දින

## කාර්යාලයේ ලියාපදිංචි ලිපිනය

363/12, සුගතදාස ස්ටේඩියම්-බ්ලෝක් ඩී, ක්‍රීඩා සංකීර්ණ රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.

## දුරකථන අංක

011 3071 838 / 011 2328 366

## විද්‍යුත් තැපෑල

sladasl@yahoo.com

## වෙබ් අඩවිය

www.antidopingsrilanka.org

## බදු හඳුනා ගැනීමේ අංකය

409386822

## විගණක

විගණකාධිපති

## බැංකුකරුවන්

ලංකා බැංකුව

# දැක්ම

## පිරිසිදු ක්‍රීඩාව ආරක්ෂා කිරීම

තරඟකාරීත්වය තුළින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ වටිනාකම සහ අඛණ්ඩතාවය ආරක්ෂා කිරීමේ අයිතිය අපි සහතික කරමු. ක්‍රීඩාවේ මූලධර්ම තුළින් සාධාරණ ක්‍රීඩාවක්, තම තරඟකරුවන්ට ගරු කිරීම සහ ක්‍රීඩකයෙකුගේ මූලික අයිතිවාසිකම් සනාථ කිරීමට අපි බලාපොරොත්තු වෙමු. මෙමගින් සියලු ම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සෞඛ්‍ය සම්පන්න ව සහ පිරිසිදු ව තරග කිරීමට ඇති අයිතිය අපි සුරකිමු. එබැවින් ඔවුන්ගේ ජයග්‍රහණ සැබෑ සැමරුමකි.

# මෙහෙවර

තහනම් ද්‍රව්‍ය භාවිතයේ අවදානම අවම කිරීම ඉලක්ක කරගත් කටයුතුවල නියැලීම, වැළැක්වීම, හඳුනා ගැනීම සහ බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම්වල යෙදීම වැනි කටයුතු තුළින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සෞඛ්‍ය හා ශ්‍රී ලාංකීක ක්‍රීඩාවේ අඛණ්ඩතාව ආරක්ෂා කිරීම.



# අරමුණු

## මූලික අරමුණ

- ශ්‍රී ලංකාවේ ජාතික තහනම් උත්තේජක මර්දන ප්‍රතිපත්තියට අනුකූල ව කටයුතු කිරීමට සහය දැක්වීම.

## ද්විතීයික අරමුණු

- ජාතික තහනම් උත්තේජක මර්දන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් රජයට, ක්‍රීඩා අමාත්‍යංශයට සහ ජාතික ඔලිම්පික් කමිටුව දැනුවත් කිරීම.
- 2021 ලෝක තහනම් උත්තේජක මර්දන නීති සංග්‍රහය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් ශ්‍රී ලංකාව පුරා ක්‍රියාවට නැංවීම ප්‍රමුඛ වීම.
- ජාතික තහනම් උත්තේජක මර්දන ප්‍රතිපත්තියට අනුකූල වීම සඳහා සියලුම ක්‍රීඩා සංගම්/ ආයතනවලට සහයෝගය ලබා දීම.
- වාණිජමය පදනමින් අදාළ වන ලෝක තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේහි කලාපීය තහනම් උත්තේජක මර්දන ආයතන ඇතුළුව අනෙකුත් තහනම් උත්තේජක මර්දන ආයතන සමග යාවත්කාලීන වූ තහනම් උත්තේජක මර්දන භාවිතයන් සහ විශේෂඥ දැනුම බෙදා ගැනීම.
- WADA සහ iNADO ඇතුළු බලගතු තහනම් උත්තේජක මර්දන ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- ජාතික වැදගත්කමක් ඇති ඉහළ මට්ටමේ ක්‍රීඩා ඉසව් සඳහා විශේෂඥ තහනම් උත්තේජක මර්දනය සම්බන්ධ උපදෙස් සහ මග පෙන්වීම් ලබා දීම.
- සියලුම ප්‍රධාන ඉසව් සම්බන්ධ වගකීම් ලෝක මට්ටමේ ප්‍රමිතියට අනුව ඉටු කිරීම.
- තහනම් උත්තේජක භාවිතය වැළැක්වීම සඳහා අවදානම් මත පදනම් වූ ඒකාබද්ධ වැඩසටහනක් ලබා දීම.
- අභ්‍යන්තර හා බාහිරව විශේෂඥයන් යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක භාවිතයේ අවදානම අඛණ්ඩව ඇගයීමට ලක් කිරීම.
- නීතිය බලාත්මක කිරීම ඇතුළු ව පවතින කඳවුරු තුළින් බුද්ධි තොරතුරු රැස් කිරීම පිළිබඳ නිපුණතා වැඩි කිරීම.
- ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සහ අධ්‍යාපනික දර්ශනය හරහා අධ්‍යාපන වැඩසටහන් හරහා වැළැක්වීම මත පදනම් වූ සාරධර්ම සබල කිරීම, ඉතා සුදුසු ප්‍රායෝගික මෙවලම් සහ උපකාරක සේවා වර්ධනය මගින් සහාය වීම.
- බුද්ධි තොරතුරු ප්‍රමුඛ, ජවසම්පන්න සහ ප්‍රතිග්‍රාහක පරීක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- තහනම් උත්තේජක මර්දන නීති උල්ලංඝනය කිරීම දැඩි ලෙස විමර්ශනය කර නඩු පැවරීම.
- ජාත්‍යන්තර ප්‍රතිපත්ති සහ භාවිතයන් යොදා ගනිමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ඒකාකාර ක්‍රීඩා පිටියක් ප්‍රවර්ධනය කිරීම.

# වැදගත් සංධිස්ථාන

**2013**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ස්ථාපිත කිරීම


PARLIAMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

CONVENTION AGAINST DOPING IN SPORT ACT, No. 33 OF 2013

**2018**

15 වන ආසියාතික - ශාන්තිකර කලාපීය අන්තර් රාජ්‍ය අමාත්‍යවරුන්ගේ සමුළුව පැවැත්වීම






**2019**

මහල් පහකින් යුත් කාර්යාලීය ගොඩනැගිල්ල විවෘත කිරීම





**2021**

නවීන තාක්ෂණික උපකරණ සහිත පරීක්ෂණාගාරයක් විවෘත කිරීම





# ප්‍රධාන කාර්ය සාධන සාරාංශය

| විස්තරය | ගණන | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|
| තහනම් උත්තේජක පරීක්ෂණ සිදුකිරීම | ගණන | 134 | 276 | 260 | 106 | 177 |
| උත්තේජන ලබාගැනීම් තහවුරු වීම් | ගණන | 5 | 10 | 6 | 2 | 4 |
| විනය පරීක්ෂණ පැවැත්වීම | ගණන | 4 | 6 | 6 | 8 | 2 |
| අභියාචනා පරීක්ෂණ පැවැත්වීම | ගණන | 1 | - | 3 | - | 4 |
| ක්‍රීඩකයන් හා ඊට අදාළ පුද්ගලයින් දැනුවත් කිරීම | වැඩසටහන් | 51 | 67 | 46 | 28 | 29 |
| දැනුවත් කිරීම් වැඩසටහන් වලට සහභාගී වූ පුද්ගලයින් | පුද්ගලයින් | 3579 | 2114 | 3357 | 965 | 1072 |
| පර්යේෂණ Abstract වාර්තා | ගණන | 0 | 3 | 0 | 1 | 0 |
| පර්යේෂණ වාර්තා ප්‍රකාශනය | ගණන | 0 | 0 | 0 | 0 | 2 |
| මෘදුකාංග සංවර්ධනය (ජංගම සහ වෙබ්) | ගණන | 0 | 1 | 1 | 1 | 0 |
| මුළු කාර්ය මණ්ඩලය | පුද්ගලයින් | 17/27 | 23/27 | 23/27 | 22/28 | 22/29 |
| වැටුප් හා වේතන | රු.මි. | 11.1 | 13.1 | 13.4 | 13.4 | 15.5 |
| ආදායම | රු.මි. | 0.03 | 0.42 | 0.72 | 2.93 | 1.85 |
| දේපළ පිරියත උපකරණ | රු.මි. | 106 | 194 | 273 | 286 | 270 |
| ජංගම වත්කම් | රු.මි. | 14.9 | 2.3 | 4.9 | 4.6 | 7.4 |
| ජංගම වගකීම් | රු.මි. | 10.7 | 9.4 | 8.2 | 15.3 | 16.0 |



# සභාපතිතුමාගේ පණිවිඩය

2021 මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විශිෂ්ට කාර්ය සාධනයක් දක්වා ඇති බව මා ප්‍රකාශ කර සිටින්නේ ඉතා සතුටිනි. වසර ගණනාවක් පුරාවට ක්‍රීඩාවේ පිරිසිදු පරිචයක් කරා ක්‍රීඩක/ක්‍රීඩිකාවන් මෙහෙයවමින්, අසාධාරණ තරගකාරිත්වයට බාධා පමුණුවමින් අප ආයතනය ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ දැවැන්ත කාර්ය භාරයක් ඉටු කරනු ලබයි.

ලංකාව නියෝජනය කරමින් අන්තර්ජාතික ක්‍රීඩා තරගවලදී ක්‍රීඩා කිරීමට, අප රටේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් නුසුදුසු (Non-Compliance) නොවීම සඳහා පවත්වා ගත යුතු උත්තේජක මර්දන ප්‍රමිතීන් අන්තර්ජාතික නියමයන්ට අනුකූල ව නිසි පරිදි පවත්වාගෙන යාමට අප ආයතනය වගකීමෙන් යුතු ව ක්‍රියාත්මක වෙයි.

ක්‍රීඩාවක් තුළ ජය හෝ පරාජය ලැබුව ද ක්‍රීඩකයෙකු හෝ ක්‍රීඩිකාවක සතු ආත්ම අභිමානය නොසැලී පවතින්නේ එය පිරිසිදු හා අව්‍යාජ වීම තුළ ය. ක්‍රීඩාවක ජයග්‍රහණයට නිසි මාවත විවර වන්නේ, නිරන්තර පුහුණුව, කැපවීම හා අනන්‍ය වූ දක්ෂතාවය තුළිනි. කෙසේ නමුත් නූතන තාක්ෂණික දියුණුව තුළින් අත්පත් කරගත් අනිසි ඵලයක් ලෙස තහනම් උත්තේජක, අද වන විට ක්‍රීඩාවේ පිරිසිදු බවට මරු පහරක් එල්ල කරමින් සිටී.

මෙවන් පසුබිමක් තුළ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය යටතේ ක්‍රියාත්මක වන ලොව පුරා විසිරී පවතින උත්තේජක මර්දන නියෝජ්‍යායතනවල කාර්යභාරය ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාව තුළ ද මෙම තහනම් උත්තේජක සම්බන්ධ අවදානම හිස ඔසවමින් පවතින බව පසුගිය වසර කිහිපයක තහනම් උත්තේජක පරීක්ෂණ වාර්තා අනුව පෙනී යයි.

පර්යේෂණ තුළින් ලද ප්‍රතිඵල අනුව තහනම් උත්තේජක සම්බන්ධ ව ශ්‍රී ලාංකික ක්‍රීඩකයා සතු දැනුවත්භාවය ප්‍රමාණවත් නොවන බව පෙනී යාමත් සමඟ පසුගිය වසර කිහිපය තුළ මේ සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල් අයුරින් දීප ව්‍යාප්ත ව සංවිධානය කරන ලදී. ඒ ඔස්සේ තහනම් උත්තේජක භාවිතයේ අනිසි ඵල විපාක, නීතිය ඉදිරියේ වරදකරුවන් බවට පත්වීම සහ ක්‍රීඩාවේ අනාගතයට සිදුවන බලපෑම පිළිබඳ ක්‍රීඩකයන්ට අවබෝධය ලබා දීම ආදිය සිදු වේ. මෙහි දී විශේෂාකාරයෙන් ක්‍රීඩකයන්ට පමණක් නොව මේ සම්බන්ධ අනෙකුත් පාර්ශවයන් සඳහා ද දැනුවත් කිරීමේ ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

වත්මන් අභියෝගකාරී සමාජ, ආර්ථික පසුබිම තුළ වුව ද ක්‍රීඩාවේ උන්නතිය සඳහා ක්‍රියාත්මක කරන සියලු වැඩසටහන්, පර්යේෂණ සහ විමර්ශන කටයුතු අඛණ්ඩ ව පවත්වාගෙන යාමට සමත් වීම අප ආයතනය ලද භාග්‍යයක් ලෙස සැලකිය හැකි ය. විශේෂයෙන් පවත්නා අභියෝග මධ්‍යයේ වුව ද ක්‍රීඩාවේ අව්‍යාජ බව පිරිසිදු බවට තර්ජනයක් වූ පුද්ගලයන් නීතියේ රැහැනට හසු කරවා ගැනීමේ කටයුතු කිසිදු අඩුවකින් තොර ව ක්‍රියාත්මක කිරීමට

අප සමත් වී ඇත. ඒ අනුව තරගාවලි තුළ මෙන් ම තරගාවලියෙන් බැහැරව ද තහනම් උත්තේජක සඳහා මුත්‍රා සාම්පල පරීක්ෂණ වැඩි වශයෙන් සිදු කරන ලදී. විශේෂඥකාරයෙන් පැමිණිලි මත පදනම්ව ද පරීක්ෂණවලට යොමුවීම නිසා තහනම් උත්තේජක ලබා ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වැඩි ප්‍රමාණයක් හඳුනා ගෙන ඔවුන්ට එරෙහිව පියවර ගැනීමට හැකියාව ලැබුණි.

තව ද ක්‍රීඩා සඳහා යොදා ගන්නා සතුන්ට ද තහනම් උත්තේජක ලබා දීමේ සිදුවීම් පසුගිය වසරවල දී වාර්තා විය. ඒ ඔස්සේ ක්‍රියාත්මක වෙමින් ශ්‍රී ලංකාවේ උත්තේජක මර්දන නීතිය අශ්ව ක්‍රීඩා සහ තුරඟ තරඟ සඳහා යොදාගන්න සතුන් දක්වා පුළුල් කිරීමට කටයුතු ද මේ වන විට ආරම්භ කර ඇත. දැනටමත් පවත්නා ප්‍රතිපාදන යටතේ සතුන්ට තහනම් උත්තේජක භාවිතය තහනම් කර පැවතිය ද, වඩා පුළුල් සහ ඵලදායී අන්දමින් එය ක්‍රියාත්මක කරවා ගැනීමට අශ්ව ක්‍රීඩා සහ තුරඟ තරඟ සඳහා තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව මේ වන විට අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අප සමත් ව තිබේ. එමගින් එම සතුන්ට ඇතිවිය හැකි අහිතකර සෞඛ්‍යමය බලපෑම් නතර කිරීමට ද ක්‍රීඩාවේ ජීව ගුණය රැක ගැනීමට ද හැකිවනු ඇත.

එලෙස ම 2020 වසරේ පටන් ම පැවති COVID 19 වසංගත තත්වය තුළ 2021 වසරේදීත් පැන නැගුණු අභියෝග සාර්ථකව ජය ගනිමින් කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් සහ විනය කමිටු හා අභියාචනා කමිටු මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ ZOOM තාක්ෂණය මගින් සංවිධානය කිරීම මෙම වසර තුළ ද අඛණ්ඩව සිදු කරන ලදී. ඉදිරියේ දී රටේ තත්ත්වය යථාවත් වුව ද එමගින් ලද තාක්ෂණික ප්‍රබෝධය ප්‍රගතිශීලී ලෙස ඉදිරියට පවත්වාගෙන යාමට අප සැලසුම් සකස් කර ඇත.

එසේම මෙම අභියෝගකාරී කාලය තුළ දී උත්තේජක මර්දන නීතිය ලංකාව තුළ නිසි පරිදි බලාත්මක කිරීමට අවශ්‍ය වන උත්තේජක මර්දන රීති සහ තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සියලු කටයුතු සපුරා ගැනීමට හැකිවීම ආයතනයක් ලෙස තම වගකීම උපරිම ලෙස ක්‍රියාත්මක කිරීමට දැරූ ප්‍රයත්නයක් ලෙස හඳුනාගත හැකි ය.

තහනම් උත්තේජක සම්බන්ධ පරීක්ෂණ ඉදිරියේ දී තවදුරටත් පුළුල් කිරීමට අප බලාපොරොත්තු වන අතර ඒ සඳහා පරීක්ෂණ අදියර සඳහා සහභාගී වන නිලධාරීන් අලුතින් බඳවාගෙන ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබා දීමට ද සැලසුම්කර ඇත.

එසේම 2022 වර්ෂය වන විට තවදුරටත් විශේෂ සැලසුම් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර මූලික වශයෙන් දැනටමත් විවෘතකර ඇති පර්යේෂණ රසායනාගාරයේ වැඩ කටයුතු සාර්ථකව ඉදිරියට ගෙන යාමට බලාපොරොත්තු වේ. ඒ හරහා ශ්‍රී ලංකාවේ පිරිසිදු ක්‍රීඩා ජවය නගා සිටුවීමට හැකිවනු ඇති අතර අන්තර්ජාතික මට්ටමේ පර්යේෂණ සඳහා ද අවකාශය සිම්වනු ඇත.

තවද තහනම් උත්තේජක පිටු දකිමින් ආත්ම විශ්වාසයෙන් සහ අවංක අධිෂ්ඨානයෙන් යුතු ව ක්‍රීඩාවට පිවිසීමේ වැදගත්කම පාසල් වියේ සිට ම දරුවන්ගේ මනසට ඇතුලු කිරීමේ අරමුණින් පාසල් විශය නිර්දේශය තුළට තහනම් උත්තේජක සම්බන්ධ තොරතුරු ඇතුල් කිරීමට ද මේ වන විට සැලසුම් සකස් කරමින් පවතී.

මෙවන් විශිෂ්ට කාර්ය සාධනයක් දක්වමින් පසුගිය වසරක කාල පරිච්ඡේදය පුරාවට ආයතනයේ වැඩ කටයුතු නිසි පරිදි ඉටු කිරීමට කැපවීමෙන් කටයුතු කළ සහ නන් අයුරින් සහයෝගය දැක්වූ සියලුම පාර්ශවයන්ට මාගේ කෘතඥතාවය පිරිනමමි. එලෙසම එළඹෙන වසර තුළදී තවදුරටත් විධිමත් මෙන්ම අර්ථාන්විත ආකාරයට පිරිසිදු, අව්‍යාජ ක්‍රීඩාව නගා සිටුවීමේ මග සකස් කරමින් ආයතනයේ දැක්ම සහ මෙහෙවරට ජීවයක් දීමට සියලුම දෙනාට ශක්තිය සහ ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.



**මහාචාර්ය අර්ජුන ද සිල්වා**
සභාපති



# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ මහත් කතා බහට ලක් වූ 2021 වසර, මුළු මහත් ලෝක වාසීන්ට ම කොවිඩ් 19 වසංගත උවදුර මධ්‍යයේ අභියෝගාත්මක ව ගත කිරීමට සිදුවිය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට වසර අටක් සපිරෙන 2021 වසර, ආයතනයේ කඩයිම් රැසක් සනිටුහන් වූ වසරක් ලෙස හැඳින්විය හැක. අව්‍යාජ ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම, තහනම් ද්‍රව්‍ය හා ක්‍රම භාවිතය මුලිනුපුටා දැමීමත් තේමා කොටගෙන ක්‍රියාත්මක වන අප ආයතනය, වසර මුළුල්ලේ පැවති ගෝලීය වසංගත තත්වය මධ්‍යයේ සිය වගකීම මැනවින් ඉටු කිරීමට කටයුතු කෙරිණි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ප්‍රධාන කර්තව්‍යක් වන තහනම් උත්තේජක පරීක්ෂණ පැවැත්වීම වසර පුරා අවස්ථානුකූල ව සිදුකිරීමට අපට හැකි විය. ඒ අනුව 2021 වසර තුළ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මූත්‍රා සාම්පල යොදා ගනිමින් තහනම් උත්තේජක පරීක්ෂණ 177ක් සිදු කර ඇත.

එම පරීක්ෂණ "ක්‍රීඩාවේ දී" හා "ක්‍රීඩාවෙන් පිටත දී" ලබා ගන්නා ලද මූත්‍රා නියදි ඔස්සේ සිදු කළ අතර මෙලෙස ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා ගැනීමේ දී "Smart Testing" සංකල්පය භාවිතා කිරීමට ද අපි කටයුතු කෙළෙමු. 2021 වසරේ දි විටින් විට ගෝලීය වසංගත තත්වය උත්සන්න වන අයුරු අපට දැකගත හැකි විය. මෙම වසංගත තත්වය මධ්‍යයෙත් 2021 වසර තුළ දැනුවත් කිරීම් වැඩසටහන් 29ක් සංවිධානය කළ අතර ඒ සඳහා 1042ක් සහභාගී විය. ඒ සඳහා ඉලක්කගත කණ්ඩායම ලෙස ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන්, පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දෙමාපියන් ඇතුළු ක්‍රීඩාව හා උනන්දුවක් දක්වන පාර්ශව රැසක් සහභාගි විය.

2021 වසරේ අප්‍රේල් 09වන දිනය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට වැදගත් දිනයකි. එදින ගරු තරුණ හා ක්‍රීඩක අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිදුන් හා ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු තේනුක විදානගමගේ මැතිදුන් අතින් අපගේ නව පර්යේෂණාගාරය ශ්‍රී ලාංකික ක්‍රීඩා ප්‍රජාව වෙනුවෙන් විවෘත කෙරිණි. මේ සඳහා අමාත්‍යංශ ලේකම්වරුන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගි වුණි.

2021 වසර තුළ දී ආයතනයේ පුරප්පාඩු වී තිබූ මාණ්ඩලික තනතුරු ද ඇතුළු ව තනතුරු පහක් සඳහා නිලධාරීන් බඳවා ගැනීම සිදු කළ අතර එමගින් වඩා වේගවත් ව හා ප්‍රශස්ත ව ආයතනයේ අරමුණු කරා ගමන් කිරීමට අවකාශය සැලසුණි. 2020 වසරේ දී අප විසින් නිර්මාණය කරන ලද තහනම් ද්‍රව්‍ය හඳුනා ගැනීමේ ඇන්ඩ්‍රොයිඩ් යෙදුම 2021 වසරේ දී තවදුරටත් යාවත්කාලීන කිරීම සිදුකරන ලදි. එම යෙදුම Apple iOS උපාංගවල ද භාවිතා කිරීමට හැකිවන පරිදි නිර්මාණය කිරීමට අවශ්‍ය මූලික අඩිතාලම මෙම වසරේ දී යොදන ලදි.

ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් තහනම් ද්‍රව්‍ය හා බැඳි නීති රෙගුලාසි කලින් කලට යාවත්කාලීන කිරීම සිදුකරයි. ඒ අනුව 2021 වසරේ සිට බල පැවැත්වෙන ලෙස සිදුකරන ලද සංශෝධනයන් අනුව ශ්‍රී ලංකාවේ ද එම නීති රෙගුලාසිවලට අනුගත කිරීමට අවශ්‍ය නීති කටයුතු අප විසින් සම්පාදනය කරන ලදි. එහිදී විශේෂයෙන් ම තහනම් ද්‍රව්‍ය භාවිතය ක්‍රම පිටුදැකීම සඳහා සිදුවිය යුතු මූලික ම අවශ්‍යතාවය ලෙස "අධ්‍යාපනය" (Education) ප්‍රවර්ධනය කිරීම දක්වා තිබේ. අපගේ ආයතනයේ මැදිහත්වීම මත ශ්‍රී ලාංකික පාසල් අධ්‍යාපනය පෙළ පොත් විෂය නිර්දේශයන් සඳහා ක්‍රීඩාවේ දී භාවිතා නොකළ යුතු තහනම් ද්‍රව්‍ය සහ පිටුදැකීම හා සම්බන්ධ විෂය කරුණු ඇතුළත් කිරීමට කටයුතු කරන ලදි. 2023 වසරේ දී 6,8 සහ 10 වසර සඳහා ද 2024 වසරේ සිට 7,9 හා 11 වසර පාසල් පෙළ පොත් විෂය නිර්දේශ සඳහා ද මෙම කරුණු ඇතුළත් කිරීමට හැකි වීම අප ලද සුවිශාල භාග්‍යයකි.

ඖෂධවේදීන් සඳහා ද තහනම් ද්‍රව්‍ය අඩංගු ආහාර අතිරේක හා ඖෂධ විකිණීමේ දී අවශ්‍ය දැනුවත්භාවය ලබා දීමට විශේෂ වැඩසටහනක් ද මෙම වසරේ ආරම්භ කෙරිණි. මෙය ද අඛණ්ඩ ව ඉදිරි වසරවලදී තව දුරටත් පුළුල් කිරීමට අපි බලාපොරොත්තු වෙමු. 2021 වසරේ අප ලැබූ ප්‍රගතිය ඉදිරි වර්ෂවල තව දුරටත් තීව්‍ර කරලීමට ද අපි බලාපොරොත්තු වන්නෙමු. ඒ තුළින් වඩා තිරසර වූ අව්‍යාජ ක්‍රීඩා සංස්කෘතියක් බිහි කරලීමට හැකියාව ලැබෙනු ඇත. 2021 වසර තුළ දී අප ලැබූ අභිවෘද්ධිය සඳහා දායක වූ සියලු දෙනාටම කෘතවේදීත්වය පළ කරන අතර අනාගතයේදීත් ශ්‍රී ලංකාවේ අව්‍යාජ ක්‍රීඩාවට මහත් වූ සේවයක් කිරීමට හැකිවේවා යැයි සුභාශිංසනය කරමි.

**වෛද්‍ය සීවලී ජයවික්‍රම**
අධ්‍යක්ෂ ජනරාල්



# අධ්‍යක්ෂ මණ්ඩලය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය, සභාපතිවරයා ඇතුළු ව සාමාජිකයන් දස දෙනෙකුගෙන් (10) සමන්විත වේ.



**මහාචාර්ය අර්ජුන ද සිල්වා - සභාපති**
(ජ්‍යේෂ්ඨ මහචාර්ය රාගම වෛද්‍ය පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය)



**මහචාර්ය ලාල් ජයකොඩි - සාමාජික**
(හිටපු සභාපති, ජාතික ඖෂධ නියාමන අධිකාරිය)



**මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු - සාමාජික**
(හිටපු සභාපති, ජතික අන්තරායක ඖෂධ පාලක මණ්ඩලය)



**ඩබ්ලිව්.ඒ. කුලසූරිය - සාමාජික**
(අතිරේක ලේකම් - පාලන, ග්‍රා.පා.ක්‍රී.ය.ප.ප්‍ර.රා. අමාත්‍යාංශය)



**ඒ.ජේ.එස්.එස්. එදිරිසූරිය - සාමාජික**
(අධ්‍යක්ෂ ජනරාල් - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව)



**වෛද්‍ය. ලාල් ඒකනායක - සාමාජික**
(අධ්‍යක්ෂ ජනරාල් - ක්‍රීඩා වෛද්‍ය ආයතනය)



**සජිත් ජයලාල් - සාමාජික**
(අධ්‍යක්ෂක - ජාතික ක්‍රීඩා විද්‍යායතනය)



**එස්.අයි.එම්. රෝසා - සාමාජික**
(අධ්‍යක්ෂක - ජාතික අයවැය දෙපාර්තමේන්තුව)



**වෛද්‍ය. අන්වර් හම්දාන් - සාමාජික**
(අධ්‍යක්ෂක - සෞඛ්‍ය අමාත්‍යාංශය)



**වෛද්‍ය. නිහාල් මුණසිංහ මහගමගේ - සාමාජික**
(නිර්වින්දන විශේෂඥ වෛද්‍ය)

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

## අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

2013 අංක 33 දරන ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක භාවිතයට එරෙහි සම්මුති පනතේ 15වන වගන්තිය යටතේ නියෝජ්‍යායතනයේ පරමාර්ථවලට සම්බන්ධ යම් කාරණයක් හෝ සියලු කාරණා පිළිබඳව අමාත්‍යවරයා විසින් යොමු කරනු ලබන යම් කාරණයක් පිළිබඳව ද අමාත්‍යවරයාට උපදෙස් දීම මණ්ඩලයේ වගකීම වේ.

තවද, පනතේ අංක 16වන වගන්තිය ප්‍රකාරව, අමාත්‍යවරයා විසින් වරින් වර ලියවිල්ලක් මගින් කලින් කලට විශේෂ හෝ පොදු විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

## පරිපාලන භූමිකාව

2013 අංක 33 දරන ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක භාවිතයට එරෙහි සම්මුති පනතට අනුව, නියෝජ්‍යායතනයේ කටයුතු පරිපාලනය, කළමනාකරණය සහ පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ.

නියෝජ්‍යායතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින්, මේ පනත මගින් නියෝජ්‍යායතනය වෙත පවරන ලද හෝ ඒ මත පනවන ලද හෝ එයට භාරදෙන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම කළ යුතු ය.

## නායකත්ව භූමිකාව

එහි නායකත්ව භූමිකාව තුළ, අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරිවලට, පාලනය සහ පහත සඳහන් ක්‍රියාකාරීත්වයට මඟ පෙන්වීම ඇතුළත් විය යුතුය.

- උත්තේජක මර්දන ක්‍රියා සැලසුම් කිරීමට, සම්බන්ධීකරණය කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ අධීක්ෂණය කිරීම
- උත්තේජක මර්දන නීති උල්ලංඝනය කිරීම් වලට එරෙහිව පියවර ගැනීම
- යම් චංචල හෝ නිශ්චල දේපලක් (විකිණීමෙන්, ත්‍යාග මගින් හෝ අන්‍යාකාරයකින්) අත්කර ගැනීමට, දැරීමට, බද්දට හෝ දීමට, උකස් කිරීමට, ඔඩපනය කිරීමට සහ විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට
- කිසියම් බැංකුවක ජංගම සහ ඉතිරිකිරීමේ ගිණුම් ආරම්භ කර පවත්වාගෙන යෑම
- ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් හෝ පරිත්‍යාග භාර ගැනීම
- නියෝජ්‍යායතනයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ එහි කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් සියලුම ගිවිසුම්වලට ඇතුල් වීම හෝ ඉටු කිරීම

- නියෝජ්‍යායතනයට අයිති මුදල් කිසිවක් ආයෝජනය කිරීම
- එහි කර්තව්‍යය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණයක් ණයට ගැනීම
- මෙම පනත යටතේ නියෝජ්‍යායතනයේ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, පරිශ්‍රමික දීම සහ ඔවුන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ ඒ සේවකයන් පහ කිරීම
- නියෝජ්‍යායතනය විසින් සපයන ලද සේවා සහ සහාය වෙනුවෙන් ගාස්තු අය කිරීම
- එහි කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය යැයි නියෝජ්‍යායතනය අදහස් කරන වෙනත් යම් සියලු දේ සිදු කිරීම

## රැස්වීම් සහ පැමිණීම්

අධ්‍යක්ෂ මණ්ඩලය 2021 වසර සඳහා අවස්ථා 12ක දී රැස් වූ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ පැමිණීම පහත සඳහන් පරිදි වේ.

| නම | ජනවාරි 21 | පෙබරවාරි 18 | මාර්තු 18 | අප්‍රේල් 29 | මැයි 20 | ජූනි 17 | ජූලි 15 | අගෝස්තු 19 | සැප්තැම්බර් 16 | ඔක්තෝම්බර් 21 | නොවැම්බර් 25 | දෙසැම්බර් 21 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මහාචාර්ය අර්ජුන ද සිල්වා | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| මහචාර්ය ලාල් ජයකොඩි | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | — | ✓ | ✓ | ✓ | ✓ |
| මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| ඩබලිව්.ඒ. කුලසූරිය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| ඒ.ජේ.එස්.එස්. එදිරිසූරිය | ✓ | — | — | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | — | ✓ |
| වෛද්‍ය. ලාල් ඒකනායක | — | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| සජිත් ජයලාල් | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | — | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| එස්.අයි.එම්. රෝසා | ✓ | ✓ | — | — | ✓ | ✓ | ✓ | ✓ | — | ✓ | — | — |
| වෛද්‍ය. අන්වර් හම්දාන් | — | ✓ | ✓ | — | — | — | — | — | — | — | ✓ | ✓ |
| වෛද්‍ය. නිහාල් මුණසිංහ මහගමගේ | — | — | — | — | ✓ | ✓ | — | ✓ | — | — | — | — |

# සංවිධාන ව්‍යුහය



සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ)
සහකාර අධ්‍යක්ෂ
ගණකාධිකාරි
පර්යේෂණ නිලධාරි (03)
තොරතුරු තාක්ෂණ නිලධාරි
පරිපාලන නිලධාරි
නීති නිලධාරි / මාණ්ඩලික ලේකම්
අධ්‍යක්ෂ (බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම)
සහකාර අධ්‍යක්ෂ
සංවර්ධන නිලධාරි
සංවර්ධන නිලධාරි
තාක්ෂණ සහකාර (01) (පර්යේෂණාගාර)
භාෂා පරිවර්තක
සංවර්ධන නිලධාරි
තාක්ෂණ සහකාර (01)
කළමනාකරණ සහකාර
රියදුරු (04)
කාර්යාල කාර්ය සහායක (03)
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
HM
MM 1-1
AR-1
JM
MA-4
MA-3
MA 1-1
MA 2-1
PL-3
PL-1

# කාර්ය මණ්ඩල තොරතුරු

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත 29දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇත.

| | තනතුරු නාමය | වැටුප් තලය | තනතුරු සංඛ්‍යාව | වර්තමාන සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01. | අධ්‍යක්ෂ ජනරාල් | HM 2-1 | 1 | 1 | |
| 02. | අධ්‍යක්ෂ | HM 1-1 | 2 | | 2 |
| 03. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ | MM 1-1 | 2 | 2 | |
| 04. | ගණකාධිකාරී | MM 1-1 | 1 | 1 | |
| 05. | නීති නිලධාරී/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | MM 1-1 | 1 | | 1 |
| 06. | පර්යේෂණ නිලධාරී | AR 1 | 3 | 3 | |
| 07. | පරිපාලන නිලධාරී | JM 1-1 | 1 | 1 | |
| 08. | තොරතුරු තාක්ෂණ නිලධාරී | JM 1-1 | 1 | 1 | |
| 09. | භාෂා පරිවර්තක | MA 4 | 1 | 1 | |
| 10. | සංවර්ධන නිලධාරී | MA 3 | 3 | 3 | |
| 11. | කළමනාකරණ සහකාර | MA 1-1 | 4 | 4 | |
| 12. | තාක්ෂණ සහකාර | MA 2-1 | 2 | 1 | 1 |
| 13. | රියදුරු | PL 3 | 4 | 2 | 2 |
| 14. | කාර්යාල කාර්ය සහයක | PL 1 | 3 | 2 | 1 |
| **එකතුව** | | | **29** | **22** | **7** |



# මෙහෙයුම් ප්‍රගතිය

# අධ්‍යාපන හා පරීක්ෂණ අංශය

අපගේ ජීවිතයට ක්‍රීඩාව මෙතරම් සමීප වන්නේ කායික මානසික නිරෝගීකමට වඩා, ආධ්‍යාත්මික ශික්ෂණයෙන් ද, මනා පෞරුෂයෙන් ද හෙබි පරිපූර්ණ මිනිසකු බිහි කිරීමට එමගින් ලැබෙන මහගු දායකත්වය නිසා ය. ශතවර්ෂ 25කටත් වඩා ඈතට දිවෙන අභිමානවත්,ප්‍රෞඪ ඉතිහාසයක් හිමි ජාත්‍යන්තර ක්‍රීඩාව, වර්තමානය වන විට අතිශය දියුණු හා ඉතා සංකීර්ණ තත්ත්වයකට පත් ව තිබේ. එය කෙමෙන්, කෙමෙන් නවීකරණයටත්, වාණිජකරණයටත් ලක් වන විට එහි ප්‍රමුඛ තේමාවක් වූ "ක්‍රීඩාශීලි සහභාගිත්වය" නමැති සංකල්පයේ වැදගත්කම ද ටිකෙන් ටික යටපත් වී, "හුදු ජයග්‍රහණය ම" හඹා යෑමේ නියත ඉලක්කයන් හා ඒකායන අභිලාශයන් නූතන ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ වර්ධනය වී ඇත. වර්තමාන ක්‍රීඩාව මෙතරම් සංවිධානාත්මක වී, දියුණු වී හා වර්ධනය වී ඇත්තේත්, ඊට ඉහළ ම තරගකාරිත්වයක් ආරෝපණයවී ඇත්තේත් එම ක්ෂේත්‍රය තුළ දැන් පවතින මේ දැඩි ජයග්‍රහණ පිපාසය නිසාවෙනි.

තවද, ක්‍රීඩාව කෙමෙන් වැඩී, වර්ධනය වී, එහි තරගකාරී බව ද වැඩි වී අතිනවීන හා දියුණු තාක්ෂණික උපක්‍රම හා මෙවලම් නූතනයේ දී ඊට අනුබද්ධ වන විට, ඒවා ක්‍රමවත් ව මෙහෙයවීමේ, හැසිරවීමේ හා පාලනය කිරීමේ පොදු නීතිරීති පද්ධතියක අවශ්‍යතාව හා වැදගත්කම දැඩි ව ඉස්මතු වෙයි. ක්‍රීඩාවේ දී තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම භාවිතා කිරීම පාලනය කිරීමට අදාළ නීතිරීති දෙස් විදෙස් ක්‍රීඩා ක්ෂේත්‍රයන් තුළට ඇතුළත් වී ඇත්තේත් මෙහි ප්‍රතිඵලයක් වශයෙනි.





















තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම භාවිතයේ ඇති අතිශය භයානක ප්‍රතිඵල වනුයේ එමගින් අතිදක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මුළුමහත් ක්‍රීඩා දිවිය ම අකලට මිලින වී යෑමත්, ඒ තුළ ඔවුන්ගෙන් ලැබීමට තිබෙන ජාත්‍යන්තර මට්ටමේ වටිනා ක්‍රීඩා ජයග්‍රහණ නිරපරාදේ රටට අහිමි වීමත්, ජගත් කෙළිබිමේ දී ප්‍රසිද්ධියට පත්වන මෙවැනි ආන්දෝලනාත්මක සිදුවීම් නිසා මුළුමහත් රටටත්, ජාතියටත් බලවත් අවමානයක් හා අපකීර්තියක් සිදුවීමත් ය. අනෙක් අතට, වත්මන් ක්‍රීඩාවෙහි නියැලෙන රටේ ජීවනාලිය බඳු ජාතියේ මතු පරපුරෙහි ශාරීරික හා මානසික නිරෝගීතාවය හා යෝග්‍යතාවය පිරිහී ගොස් රෝගී සමාජයක් අනාගතයේ දී බිහිවීමට ඇති ඉඩකඩ වැඩිවීම ද දිගුකාලීන වශයෙන් මෙහි පවත්නා තවත් ගැටලුවකි. එබැවින් තහනම් උත්තේජක භාවිතයෙන් වැළකී සිටීමේ වැදගත්කම අවධාරණය කරමින් මෙරට ක්‍රීඩක පරපුර සහ ඔවුන්ගේ සියලු සහායක පිරිස් දැනුවත් කිරීම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධ්‍යාපන අංශයේ මූලික පරමාර්ථය යි.

ඒ අනුව, 2021 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා සිදුකළ තහනම් උත්තේජක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ ව විස්තර පහත පරිදි වේ. ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියැලෙන්නන් අරමුණු කරගෙන මෙම වැඩසටහන් දීපව්‍යාප්ත ව ක්‍රියාත්මක කරන ලදී.



## 2021 වර්ෂයට අදාළ තහනම් උත්තේජක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ සාරාංශගත තොරතුරු

| | ඉලක්ක ගත පාර්ශවය | පවත්වන ලද වැඩසටහන් ගණන | සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | ජාතික ක්‍රීඩා කණ්ඩායම් හා ජාතික සම්මේලන | 15 | 399 |
| 02. | ඔලිම්පික් හා පැරාලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා සහභාගී වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් | 1 | 12 |
| 03. | කනිෂ්ඨ ජාතික සංචිත | 2 | 41 |
| 04. | පාසැල් ක්‍රීඩා කණ්ඩායම් හා ක්‍රීඩා සමාජ | 5 | 541 |
| 05. | ක්‍රීඩා අධ්‍යාපනඥයන් හා ශාරීරික යෝග්‍යතා උපදේශකවරුන් | 3 | 197 |
| 06. | ක්‍රීඩාව හා සම්බන්ධ උපාධි අපේක්ෂකයන් | 2 | 376 |
| 07. | උත්තේජක පාලන නිලධාරීන් හා වෛද්‍යවරුන් | 1 | 8 |

### වැඩමුළු සඳහා පුද්ගල සහභාගිත්වය



## 2021 වර්ෂයට අදාළව දැනුවත් කිරීමේ වැඩසටහන් ඉලක්කයන් සහ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ

| මාසය | ඉලක්ක ගත අගය | | සත්‍ය අගය | |
|---|---|---|---|---|
| | වැඩමුළු ප්‍රමාණය | සහභාගීත්වය | වැඩමුළු ප්‍රමාණය | සහභාගීත්වය |
| ජනවාරි | 2 | 96 | 5 | 86 |
| පෙබරවාරි | 4 | 150 | 3 | 70 |
| මාර්තු | 2 | 115 | 5 | 213 |
| අප්‍රේල් | 0 | 0 | 0 | 0 |
| මැයි | 3 | 40 | 0 | 0 |
| ජූනි | 2 | 120 | 1 | 5 |
| ජූලි | 3 | 26 | 2 | 23 |
| අගෝස්තු | 6 | 140 | 1 | 20 |
| සැප්තැම්බර් | 4 | 230 | 5 | 557 |
| ඔක්තෝම්බර් | 5 | 275 | 2 | 53 |
| නොවැම්බර් | 3 | 75 | 2 | 45 |
| දෙසැම්බර් | 2 | 97 | 3 | 128 |
| **එකතුව** | **36** | **1364** | **29** | **1072** |

### ඉලක්ක ගත වැඩමුළු ප්‍රමාණය හා සත්‍ය වැඩමුළු ප්‍රමාණය



# තහනම් උත්තේජක පරීක්ෂණ

ශ්‍රී ලංකාව තුළ තහනම් උත්තේජක භාවිතයෙන් තොර පිරිසිදු ක්‍රීඩා පරිසරයක් බිහිකිරීමත්, පිරිසිදු ක්‍රීඩක ක්‍රීඩිකාවන් ආරක්ෂා කිරීමත්, අරමුණු කරගනිමින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මඟින් 2021 වසර තුළ සිදුකරන ලද තහනම් උත්තේජක පරීක්ෂණ පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ.

**මානව තහනම් උත්තේජක පරීක්ෂණ (ක්‍රීඩාව අනුව)**

| අනු අංකය | ක්‍රීඩාව | තරග තුළ දී සිදු කළ පරීක්ෂණ | තරග වලින් පිටත දී සිදු කළ පරීක්ෂණ | මුළු තහනම් උත්තේජක පරීක්ෂණ ගණන | තහනම් උත්තේජක ලබා ගත් බවට සනාථ වූ අවස්ථා |
|---|---|---|---|---|---|
| 01. | රග්බි | - | 04 | 04 | - |
| 02. | මළල ක්‍රීඩා | 67 | 06 | 73 | 01 |
| 03. | පා පැදි | 13 | - | 13 | - |
| 04. | බර ඉසිලීම | 26 | 13 | 39 | - |
| 05. | ක්‍රිකට් | 12 | 09 | 21 | - |
| 06. | බැඩ්මින්ටන් | - | 01 | 01 | - |
| 07. | සවි එසවීම | 10 | 03 | 13 | 03 |
| 08. | ජූඩෝ | - | 01 | 01 | - |
| 09. | වෙඩි තැබීම | - | 01 | 01 | - |
| 10. | පැරා දුනු විදීම | - | 01 | 01 | - |
| 11. | පැරා ඔරු පැදීම | - | 01 | 01 | - |
| 12. | පැරා මළල ක්‍රීඩා | - | 08 | 08 | - |
| 13. | පැරා ටෙනිස් | - | 01 | 01 | - |
| | **එකතුව** | **128** | **49** | **177** | **04** |

## සත්ව තහනම් උත්තේජක පරීක්ෂණ

| අනු අංකය | ක්‍රීඩාව | තහනම් උත්තේජක පරීක්ෂණ ගණන | තහනම් උත්තේජක ලබා ගත් බවට සනාථ වූ අවස්ථා | ධනාත්මකවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 01. | තුරංග තරග | 12 | 08 | 66.6% |

### 2021 තහනම් උත්තේජක පරීක්ෂණ හා තහනම් උත්තේජක ලබා ගත් බවට සනාථ වූ අවස්ථා (මානව-මූත්‍ර)



# නීති අංශය

- 2020 අගභාගයේ හා 2021 වර්ෂය තුළ උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීම සම්බන්ධයෙන් වාර්තා වූ ක්‍රීඩකයන්ට එරෙහිව විනය පරීක්ෂණ පැවැත්වීම සහ ඒවායේ අවසන් තීරණ ප්‍රකාශයට පත් කිරීම.

- අභියාචනා පරීක්ෂණයන්හි පැහැදිලි අවසන් තීන්දු ලබාදීම සඳහා විමසීම් වට තුනක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පැවැත්වීම. එකී සෑම අවස්ථාවක දී ම වාචික හා ලිඛිත දේශන සිදු කිරීම හා අවශ්‍ය නීතිඥ සහයෝගය ලබා ගැනීම සඳහා  කටයුතු සංවිධානය කර දීම.

- අභියාචනා පරීක්ෂණ සහ විනය පරීක්ෂණ තුළින් ලබා දුන් තීන්දු නිසි පරිදි අදාළ පාර්ශව වෙත සන්නිවේදනය කිරීම.

- අභියාචනා පරීක්ෂණ සහ විනය පරීක්ෂණ මාර්ගගත තාක්ෂණය මගින් නිසි පරිදි පැවැත්වීම.

- උත්තේජක මර්දන රීති භාෂා ත්‍රිත්වයෙන් ම  නිසි පරිදි සකස් කර රජයේ ගැසට් පත්‍රය සඳහා යොමු කිරීම.

- 2022 - තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව පාර්ලිමේන්තු අනුමැතිය සඳහා යොමු කිරීමට මූලික පියවර ගැනීම.

- අශ්ව ක්‍රීඩා සහ තුරඟ තරඟ සඳහා තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව සකස් කිරීමට මූලික පියවර ආරම්භ කිරීම.

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්, මාර්ගගත තාක්ෂණය යොදා ගෙන සාම්ප්‍රදායික ක්‍රමයෙන් බැහැර ව නව මුහුණුවරකින් පැවැත්වීම.

# බලාත්මක කිරීම් හා ක්‍රියාත්මක කිරීම් අංශය

බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම අංශය 2021 වර්ෂයේ ස්ථාපිත කෙරිණි. එම අංශය මගින් තහනම් උත්තේජක මෙරටට ගෙන්වීම, බෙදාහැරීම හා භාවිතය වැළැක්වීම මූලික කරගෙන කටයුතු කරනු ලබයි. 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත හා එහි නෛතික ප්‍රතිපාදන පිළිබඳ ව රට තුළ ඒ හා සම්බන්ධ ආයතන සමඟ එක් ව දැනුවත් කිරීම් වැඩසටහන් හා පුහුණු වැඩසටහන් පවත්වමින් සුපිරිසිදු ක්‍රීඩාවක් ඇති කිරීම පිණිස කටයුතු කරයි.

| අනු අංකය | දිනය | ස්ථානය | වැඩමුළුව | ඉලක්ක ගත කණ්ඩායම | සහභාගීත්වය |
|---|---|---|---|---|---|
| 01. | 2021/11/03 | ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය | ඖෂධවේදීන් හා ඔසුසල් හිමිකරුවන්ගේ සංගම්වල නිලධාරීන් දැනුවත් කිරීමේ සාකච්ඡාව | ඖෂධවේදීන් හා ඔසුසල් හිමිකරුවන් | 06 |
| 02. | 2021/12/14 | බම්බලපිටිය පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය | 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ගැනීමට එරෙහි සම්මුති පනත පිළිබඳ ව පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව | පොලිස් නිළධාරීන් | 92 |

6වන යුද්ධ හමුදා සහය දිවීමේ තරඟාවලිය සහ 57 වන යුද්ධ හමුදා මළල ක්‍රීඩා තරඟාවලියට සමගාමී ව තහනම් උත්තේජක හා තහනම් ක්‍රම භාවිතයන් පිළිබඳ විශේෂ පැමිණිලි ලබාගැනීමේ සහ දැනුවත් කිරීමේ කුටියක් (Outreach Booth) ස්ථාපිත කිරීම හා ඒ ඔස්සේ සහභාගී වූවන් දැනුවත් කිරීම 2021/11/22 සිට 2021/11/26 දක්වා සුගතදාස ක්‍රීඩාංගනයේ දී පැවැත්විණි.





# විශේෂ පැමිණිලි ඒකකය

2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ බලතල ප්‍රකාර ව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම් අංශයේ විශේෂ පැමිණිලි ඒකකය 2021 ඔක්තෝම්බර් මාසයේ දී ස්ථාපිත කරන ලදී.

ඒ අනුව, පැමිණිලි භාරගැනීමේ ස්වරූපය පහත පරිදි ය.

- **මාර්ගගතව**
  සෑම ක්‍රීඩා සමාජයක් සඳහා ම වට්සැප් මගින් පැමිණිලි පත්‍රිකාව යොමු කෙරේ. ***sladainquiry@gmail.com*** විද්‍යුත් තැපැල් ලිපිනය හරහා ද පැමිණිලි යොමු කළ හැක.

- **භෞතිකව**
  තරගාවලිය අතර තුර පැමිණිලි පෙට්ටියක් භාවිතයෙන්.

- විශේෂ පැමිණිලි ඒකකයයෙහි විමර්ශන කටයුතු සිදු කිරීමේ දී පිටතින් ලැබෙන ඇමතුම්වලට සම්බන්ධ වීමට හා එම ඇමතුම් සඳහා ගුණාත්මක සේවාවක් ලබා දීම සඳහා එම කටයුත්ත සාර්ථක ව සිදු කිරීම උදෙසා එම කටයුත්ත වෙනුවෙන්ම **070-4220422** යන දුරකථන අංකය අප අංශය වෙත ලබා ගෙන ඇත.

**විශේෂ විමර්ශන ඒකකය සඳහා ලැබී ඇති පැමිණිලි පිළිබඳ විස්තර**

| අනු අංකය | දිනය | පැමිණිල්ල | ගත් ක්‍රියාමාර්ගය |
|---|---|---|---|
| 01. | 2021/12/11 | මළල ක්‍රීඩකයන් දෙදෙනෙකු 2021.12.11 වන දින තරගාවලිය ආරම්භ වීමට පෙර තහනම් උත්තේජක යැයි සැක කළ හැකි එන්නත් ශරීර ගත කර ගත් බව | මෙම ක්‍රීඩකයින් Out Of Competition Testing සඳහා යොමු කරන ලදී |
| 02. | 2021/12/16 | තහනම් උත්තේජක භාවිත කළ බවට චෝදනා ලැබ සිටින මළල ක්‍රීඩකයින් රජයේ පාසලක පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් ලෙස කටයුතු කරන බව | පැමිණිල්ල පිළිබඳව විමර්ශණ කටයුතු සිදුකරන ලදි |


Speak Us
ශ්‍රී ලංකා
උත්තේජක මර්දන
නියෝජ්‍යායතනය
SLADA
එන්න අප සමග එකතු වෙන්න
පිරිසිදු ක්‍රීඩාවක්
සඳහා ඔබේ දායකත්වය ලබා දෙන්න
ශ්‍රී ලංකාව තුළ,
පිරිසිදු ක්‍රීඩා පරිසරයක්
ගොඩනැගීමේ
කොටස්කරුවෙකු වන්න.
විශේෂ
පැමිණිලි ඒකකය
ඒ සඳහා තහනම් උත්තේජක හා තහනම් ක්‍රම පිළිබඳ පැමිණිලි වේතොත් පහත ක්‍රම ඔස්සේ අපට කියන්න.
2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකාව තුළ උත්තේජක මර්දන ක්‍රියා සැලසුම් කිරීම, සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීමට අපි ක්‍රියා කරන්නෙමු.
වෙබ් අඩවිය - www.slantidoping.org
විද්‍යුත් තැපෑල - sladainquiry@gmail.com
දුරකථනය - (070) 422 0 422
සෑම අවස්ථාවකදීම තොරතුරුවල රහස්‍යභාවය සුරකිනු ලැබේ.

# පර්යේෂණ අංශය

පර්යේෂණ ඒකකය මගින් සිදු කරන ලද පර්යේෂණ දෙකක පූර්ණ පර්යේෂණ වාර්තා සඟරාවල (Journal) පළ කරන ලදී.

01. ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් ආහාර අතිරේක භාවිතය, ඒවා පිළිබඳ දැනුම සහ ආහාර අතිරේක භාවිතයේ පුරුදු පිළිබඳ කරන ලද අධ්‍යයනයේ පූර්ණ පර්යේෂණ වාර්තාව අන්තර්ජාතික (Journal of Exercise and Nutrition) සඟරාවේ පළ කරන ලදි.

02. අරිෂ්ට වල තහනම් උත්තේජක තිබේදැයි සෙවීමට කළ පර්යේෂණයේ පූර්ණ පර්යේෂණ වාර්තාව “Ceylon medical journal” යන සගරාවේ ප්‍රකාශයට පත් කරන ලදි.

JEN Journal of Exercise and Nutrition

*2021, Volume 4 (Issue 3): 14* *OPEN ACCESS*

## Dietary Supplement Usage, Associated Knowledge and Attitudes of Sri Lankan National-Level Athletes: A Cross Sectional Study

*Original Research*

Rashani SAN[1*] ORCID, Pigera S[1], Fernando PNJ[1], Niriella MA[2], Jayawickreme SJ[1], De Silva AP[1,2]

[1]*Sri Lanka Anti-Doping Agency, No.363/12, Sugathadasa Stadium- Block D,Stadium Parking road, Sirimavo Bandaranaike Mawatha, Colombo 14, Sri Lanka.*
[2]*Faculty of Medicine, University of Kelaniya, Dalugama, Kelaniya, Sri Lanka.*

**Abstract**
**Purpose**: This study aimed to identify dietary supplement prevalence, reasons to use, supplement types, personal beliefs, knowledge and practices of athletes related to supplement use and doping in sports.
**Methods**: Data was collected from 386 athletes (Male; 66.8%, Female; 33.2%, Mean age ±SD; 26.22±4.9), represented national pools of 12 sport types.
**Results**: 354 (91.5%) of athletes used supplements including multivitamin (57%), electrolyte (49.7%), protein (43.5%), calcium (19.7%) and creatine (17.4%). Gender, social status, education and profession were not found to be determinants of supplement use, but sport type did ($p < 0.05$). Rugby and weightlifting players showed significant protein, multivitamin and creatine use per day ($p < 0.05$). Many athletes consumed supplements to boost their performance (41.8%) and strength (54. 5%). The majority (60.5%) claimed about self-decided supplementation plan. Male athletes had more dope-positive attitudes than females ($P<0.05$). Athletes who attended anti-doping educational workshops/were exposed to international competitions were more concerned about supplement content ($p <0.05$). A considerable number of multivitamin (51.8%), creatine (37.3%) and protein (14.8%) users consumed them without any scientific basis.
**Conclusions**: Dietary supplements appear to be widely consumed by Sri Lankan national-level athletes, whereas a considerable proportion does not follow proper nutritional assessment before use.

***Key Words***: Anti-Doping, Practices, Multivitamin

*Published July 13, 2021*

Corresponding Author: S.A.N. Rashani, meshani1nisha@gmail.com

Original article

# Screening for performance enhancing substances and quantification of ethanol in different arishta manufactured in Sri Lanka

**Punchividanelage Nilu Jayashika Fernando[1], Shehani Pigera[1], Suraweera Arachchilage Nimesha Rashani[1], Ravindra Fernando[2,4], Pabasara Weerasinghe[2], Tharaka Deepal Godakumbura[2], Madunil Anuk Niriella[3], Seevali Jayawickreme[1], Arjuna Priyadarshana de Silva[1,3]**

## Abstract

*Background* Arishta have been used in ayurveda medicine for over thousands of years in Sri Lanka to treat various diseases. Ashwagandharishta, Balarishta and Dashamoolarishta are usually prescribed to obtain an anabolic effect, and Ashwagandharishta and Dashamoolarishta for androgenic effect in males. Thus, these arishta have shown similar effects as anabolic androgenic steroids and stimulants in western medicine. Therefore, arishta could potentially be used by athletes to improve their performance in sports leading to unintentional doping. Additionally, ethanol develops in-source during arista fermentation, which can affect athletes health.

*Objective* The aim of this study was to investigate whether the anabolic androgenic steroids or stimulants banned by World Anti-Doping Agency (WADA) were present in these arishta, and to determined their ethanol content.

*Methods* Methanol extractions of Ashwagandarishta, Balarishta and Dashamoolarishta from four different manufacturers were screened for 21 stimulants and 22 anabolic androgenic steroids banned by WADA, using Gas Chromatography Mass Spectrometer (GC/MS). Ethanol content of the twelve arishta samples were also measured.

*Results* Anabolic androgenic steroids or stimulants were not present in the tested arishta samples, and percentage volume by volume (v/v) ethanol content of all arishta samples were between (5.80-8.35) ±0.5.

*Conclusion* The tested brands of Ashwagandharishta, Balarishta and Dashamoolarishta did not contain stimulants or anabolic androgenic steroids banned by WADA.

*Ceylon Medical Journal* 2020; **65:** 112-117

DOI: http://doi.org/10.4038/cmj.v65i4.9282

## Introduction

Athletes around the world use different techniques to win medals. Among them, commercially available supplements, ayurvedic medications, traditional remedies, and designer drugs are very popular. WADA operates with the aim of bringing consistency to anti-doping policies and regulations within sport organizations and governments across the world [1]. They publish annually a list of substances prohibited for use by athletes, considering that they may artificially increase an athlete's performance [1]. In Sri Lanka, the ayurveda medicinal system has been well established for thousands of years and has been successfully treating various diseases. According to the ayurveda, the human body consists of three dosa (parts) that is watha, pitha, sema. Watha refers to the energy generated by vibration and movement [2]. In western medicine this is referred to as boosting body strength, which is done by stimulants and anabolic androgenic steroids [2]. In ayurvedic practice, watha diseases are treated by Ashwagandarishta, Balarishta and Dashamoolarishta [3]. In addition to that Dashamoolarishta is prescribed for improving sperm count in males [3], similar to the use of anabolic androgenic steroids in western medicinal practice [2]. These three arishta are available in ayurvedic drug stores as over-the-counter medications. Therefore, sportsmen and sports women are able to consume these arishta in Sri Lanka in order to enhance their performance, or as a form of treatment. Arishta is produced by fermentation. Thus, the exact chemical composition of these fermented products is not known by the user. The ingredients of all these three arishta are given by the name of the plant material [3]. Athletes who use these arishta would be yielded a positive result in a urine test due to the consumption of these arishta. This unintentional or intentional doping might lead to the

[1]*Sri Lanka Anti-Doping Agency, Colombo, Sri Lanka,* [2]*The National Narcotics Laboratory, National Dangerous Drugs Control Board, Rajagiriya, Sri Lanka,* [3]*Faculty of Medicine, University of Kelaniya, Dalugama, Kelaniya, Sri Lanka,* [4]*Sir John Kotelawala Defence University, Ratmalana, Sri Lanka.*

Correspondence: NF, *e-mail: <nilujayashika@gmail.com>.* *Received 21 August 2019 and revised version 12 August 2020 accepted 02 December 2020.*

This is an open-access article distributed under the terms of the Creative Commons Attribution License, which permits unrestricted use, distribution, and reproduction in any medium, provided the original author and source are credited.

මෙම වසරේ ආරම්භ කරන ලද පර්යේෂණ දෙකක් වන SLADA ආයතනය මගින් සිදු කරනු ලබන තහනම් උත්තේජක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන ඇගයීමට ලක් කිරීමේ අධ්‍යයනය සහ තහනම් උත්තේජක විරෝධී නීති උල්ලංඝනය කිරීම් පිළිබඳ අධ්‍යයනය යන අධ්‍යයන දෙක ම අවසන් කරන ලදී.





පර්යේෂණ අංශයෙන් සිදු කළ නව සොයාගැනීම් ක්‍රීඩා ප්‍රජාව අතර බෙදා හැරීමට විවිධාකාර ලෙස කටයුතු කරන ලදී. ඒ අතර විද්‍යාත්මක පරීක්ෂණ පත්‍රිකා ක්‍රීඩා හා ශාරීරික සෞඛ්‍ය අධ්‍යයන අංශ පවතින ජාතික විශ්ව විද්‍යාලවල පුස්තකාල හා එම අධ්‍යයන අංශ වෙත ලබා දෙන ලදී. තව ද ක්‍රීඩා ප්‍රජාවට තේරුම් ගැනීමට පහසු ලෙස සැකසූ අත් පත්‍රිකා ක්‍රීඩා ප්‍රජාව තුළ බෙදා හරින ලදී. YouTube, Facebook හා ක්‍රීඩා අමාත්‍යාංශයට අනුබද්ධ වෙබ් අඩවි හරහා ජාතික මට්ටමින් මෙම දැනුම බෙදාහැරීමට කටයුතු කර ඇත. තව ද ක්‍රීඩා වෛද්‍යවරු, පෝෂණවේදීන් වැනි විවිධ ක්‍රීඩා වෘත්තිකයන් අතරද විද්‍යාත්මක පර්යේෂණ පත්‍රිකා එක් කර සැකසූ පොතක් මාර්ගයෙන් එම සොයා ගැනීම් බෙදාහැරීමට කටයුතු කරන ලදී.



# හෙළ ආයුර්වේද පාන වර්ග හා ශ්‍රී ලාංකීය ක්‍රීඩාව

ශරීර ශක්තිය හා ජවය වර්ධනය කිරීමට හෙළ ආයුර්වේද ක්‍රමයට සැකසූ අශ්වගන්ධාරිෂ්ටය, බාලාරිශ්ටය සහ දශමූලාරිෂ්ටය වැනි අරිෂ්ට වර්ග භාවිත කිරීමට අතීතයේ සිටම ශ්‍රී ලාංකික-යන් පුරුදුව සිටියි. මෙම අරිෂ්ට වර්ග වල ක්‍රීඩාවේදී භාවිතයට තහනම් කරන ලද ද්‍රව්‍ය අඩංගු වී ඇතිදැයි සෙවීමට කළ පර්යේෂණයේ ප්‍රතිඵල මෙසේය.

- මෙම පර්යේෂණයේදී ක්‍රීඩාවේ තහනම් කරන ලද ස්ටෙරොයිඩ් වර්ග 22 ක් ද උත්තේ-ජක වර්ග 21 ක් ද මෙම අරිෂ්ට තුල අන්තර්ගත නොවන බව තහවුරු විය.
- මෙම අරිෂ්ට වර්ග තුල එතනෝල මද්‍යසාර සැලකිය යුතු ප්‍රතිශතයක් පවතින බව (5.8 - 8.3) ± 0.5 (v/v) පර්යේෂණයෙන් පෙනී ගියේය.

තවද,මිනිස් සිරුර තුලදී තහනම් කළ උත්තේ-ජයක් හෝ ස්ටෙරොයිඩයක් බවට පරිවර්තනය වීමට හැකියාවක් ඇති පූර්ව රසායනික සංඝටක මෙම අරිෂ්ට තුල අඩංගු දැයි ඉදිරියේදී පරීක්ෂා කර බැලීමට නියමිතය.



antidopingagency SLAntiDoping Sri Lanka Anti-Doping Agency

මේ පිළිබඳ වැඩි දුර තොරතුරු ලබා ගැනීමට පිවිසෙන්න


Journal of Exercise and Nutrition Vol. 4 No. 3 (2021)

Ceylon Medical Journal Vol. 65, No. 4, December 2020

Sri Lanka Medical Association, 133rd Anniversary International Medical Congress. Abstract book 2020;27-28





363/12,
Sugathadasa Stadium(Block D),
Stadium Parking Road,
Sirimavo Bandaranaike Mawatha,
Colombo 14


# පිරිසිදු ක්‍රීඩාවක්

ශ්‍රී ලංකාව තුළ බිහිකිරීමට
නව පර්යේෂණ දැනුම යොදා ගනිමු...

නිවැරදි ආහාර රටාවක්,
නිරෝගී ක්‍රීඩා ප්‍රජාවක් බිහි
කිරීමට මෙන්ම
ජාත්‍යන්තර ජයග්‍රහණය
වැඩි කිරීමටද
සවියක් ලබා දෙයි

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය


ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

වෙබ් www.slantidoping.org
දුරකථන 0112328366
ඊ-මේල් sladasl@yahoo.com


## 01 ආහාර අතිරේක කෙරෙහි ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ආකර්ෂණය.

ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් ආහාර අතිරේක භාවිතය කෙරෙහි ඇති නැඹුරුතාවය සෙවීමට කල පර්යේෂණයේ ප්‍රතිඵල මෙසේය.

- මල්ටි විටමින් (57%), ඉලෙක්ට්‍රොලයිට් බීම වර්ග (49.7%), ප්‍රෝටීන (43.5%), කැල්සියම් (19.7%) සහ ක්‍රියැටින් (17.4%) අඩංගු ආහාර අතිරේක වර්ග එවා අතරින් ප්‍රධාන තැනක් ගනී.
- ක්‍රීඩාව අනුව ආහාර අතිරේක භාවිතයේ පැහැදිලි වෙනසක් පෙන්නුම් කරන ලදී.
- බොහෝ ක්‍රීඩක ක්‍රීඩිකාවන් දිනකට ආහාර අතිරේක 3ක් එකවර භාවිත කරනු ලබයි.එය ප්‍රතිශතයක් ලෙස (56.8%) කි. ඒවා ප්‍රෝටීන මල්ටිවිටමින් හා ක්‍රියැටින් අඩංගු ආහාර අතිරේක වේ.
- වයස අවුරුදු 25-31 ත් අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන් බහුල ලෙස ආහාර අතිරේක පරිභෝජනය කරයි.
- ක්‍රීඩිකාවන්ට සාපේක්ෂව ක්‍රීඩකයින් ආහාර අතිරේක කෙරෙහි වැඩි ආකර්ශනයක් පෙන්නුම් කරයි.

මෙම ප්‍රතිඵල වලට අනුව පෙනී යන්නේ, වර්තමානයේ ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් බහුල ලෙස ආහාර අතිරේක භාවිතය කෙරෙහි නැඹුරු වී ඇති බවයි.



## 02 තහනම් උත්තේජක පිළිබඳ ශ්‍රී ලාංකික ක්‍රීඩකයාගේ දැනුම

ශ්‍රී ලංකාවේ ජාතික තලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තහනම් උත්තේජක පිළිබඳ දැනුම, ආකල්ප සහ විශ්වාසයන් පිළිබඳව පරීක්ෂා කිරීමට කරන ලද පර්යේෂණයේ ප්‍රතිඵල මෙසේය.

ක්‍රීඩක ක්‍රීඩිකාවන් අතරින් 91.3% ක්‍රීඩාවේ තහනම් උත්තේජක පිළිබඳ දැනුම ඇති අතර එයින් වැඩි ප්‍රතිශතයක් ජාත්‍යන්තර මට්ටමේ තරග කළ පිරිසය.

මෙම ක්‍රීඩික ක්‍රීඩිකාවන් අතරින් 92.7% ක් ආහාර අතිරේක යහපත් සෞඛ්‍ය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය බවටද 74.6% ජයග්‍රහණයන් සඳහා අවශ්‍ය බවටද විශ්වාස කරති.

- ආහාර අතිරේක මත විශ්වාසයක් දක්වනු ලබන්නේ පුරුෂ පාර්ශවයයි.
- ක්‍රීඩකයින් 76.2% ක් ආහාර අතිරේකයක් භාවිතයට පෙර එම ලේබල පරීක්ෂා කරන අතර පෝෂණ වැඩමුළු සඳහා සහභාගි වී ඇති අය මේ සඳහා වැඩි නැඹුරුතාවයක් දක්වන බව පෙනේ.
- මෙම වැඩමුළු සඳහා සහභාගි වු අය අසනීපයකදී ප්‍රතිකාර ලබන විට තමන් ක්‍රීඩකයෙක් බව දන්වා සිටීම සිදු කරන බව අනාවරණය විය.
- තවද ආහාර අතිරේක පරිභෝජනය කරන්නන් අතරින් 41.8% ක් තමන්ගේ ක්‍රියාශීලිබව වැඩි කිරීමට ආහාර අතිරේක භාවිතා කරන අතර 54% ක් නැතිවු ශක්තිය නැවත ලබා ගැනීම උදෙසා ඒවා භාවිතා කරයි. අනෙකුත් පිරිසට ඒ පිළිබඳ කිසිදු පැහැදිලි අවබෝධයක් හෝ පරමාර්ථයක් නොතිබුණි.

මේවා භාවිත කරනු ලබන අයගෙන් 60.5% ක් ඒවා තමන්ගේ ස්ව කැමැත්තට භාවිතා කරන අතර ඒ සඳහා පුහුණුකරුවන්,වෛද්‍යවරුන් හෝ වෙනත් අයගේ උපදෙස් ලබාගෙන නොමැත.

මෙහි නිගමනය වන්නේ තහනම් උත්තේජක වැඩමුළු පෝෂණ වැඩමුළු වලට ක්‍රීඩක ක්‍රීඩිකාවන් සම්බන්ධ වුවද ඔවුන් ඒවා ප්‍රායෝගික ලෙස ක්‍රීඩා ජීවිතයට එකතු කරගත යුතු අතර ඔවුන්ගේ ආහාර අතිරේක සම්බන්ධ පුරුදු සහ ආකල්ප තවදුරටටත් දියුණු විය යුතු බවයි.

## 03 ආහාර අතිරේක භාවිතා කරන ඔබ මේ පිළිබදව දැනුවත් ද?

ප්‍රෝටිනමය ආහාර අතිරේකයක් ,මල්ටි විටමිනයක් හා ඉලෙක්ට්‍රොලයිට පානයක් දෛනික ආහාර වලට අමතරව භාවිතා කිරීම ශ්‍රී ලංකික ක්‍රීඩික ක්‍රීඩිකාවන් අතර බහුලව සිදු වෙයි.මෙම බහුවිධ ආහාර අතිරේක භාවිතය නිසා ඔවුන් තුළ වර්ධනය වීමට අවදානමක් ඇති සෞඛ්‍ය ගැටළු හඳුනාගැනීම සදහා පැවැත්වූ නියමු පර්යේෂණයේ සොයා ගැනීම් මෙසේය.

- බහුවිධ ආහාර අතිරේක භාවිත කරන ක්‍රීඩකයින් මෙන්ම ක්‍රීඩිකාවන් ද අතර රුධිර ගත කොලෙස්ටරෝල් වැඩි වීමේ ඉහළ අවදානමක් පවතී.
- බහුවිධ ආහාර අතිරේක භාවිත කරන ක්‍රීඩකයින්ගේ දේහ බර නිසි ප්‍රමාණයට වඩා වර්ධනය වීමේ ඉහළ අවදානමක් පවතී.
- මෙම තත්වයන් ආහාර අතිරේක භාවිත කරන කාලය හා නියුතු ක්‍රීඩාවේ ස්වභාවය මත වෙනස් විණි.
- ක්‍රීඩක ක්‍රීඩිකාවන් තමන්ට ආහාර වලින් ලැබෙන පෝෂක ප්‍රමාණය පිළිබද නිසි තක්සේරුවක් නොමැතිව ආහාර අතිරේක භාවිතයට පෙළඹී සිටියි.

උක්ත කරුණු සැලකිල්ලට ගනිමින් ආහාර අතිරේක භාවිත කිරීමේදී නිසි වෛද්‍ය හෝ පෝෂණවේදියකුගේ උපදෙස් ලබා ගත යුතු අතර මස 6 කට වරක් වත් රුධිර ගත මේද ප්‍රමාණය පරීක්ෂා කර ගත යුතුය.



මීට අමතර ව අවසන් කරන ලද තවත් පර්යේෂණ වාර්තා දෙකක් ප්‍රකාශනය සඳහා අන්තර්ජාතික සඟරාවලට ඉදිරිපත් කර ඇත. ඒවා පිළිබඳ විස්තර පහත පරිදි වේ.

01. ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් ප්‍රෝටීන, විටමින් ඉලෙක්ට්‍රොලෙයිට යන ආහාර අතිරේක භාවිතයේ පසු කාලීන සෞඛ්‍යමය බලපෑම පිළිබඳ අධ්‍යයනයේ සම්පූර්ණ පර්යේෂණ වාර්තාව

02. තහනම් උත්තේජන පර්යේෂණ සඳහා යොදා ගත හැකි විවිධ ජෛව සාම්පල අධ්‍යයනයට අදාළ පර්යේෂණ වාර්තාව

ශ්‍රී ලංකා උත්තේජ මර්දන නියෝජ්‍යායතනයේ නව පර්යේෂණාගාරය 2021හි අප්‍රේල් මස 09වන දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. මෙම පර්යේෂණාගාරය නවීන තාක්ෂණික උපකරණවලින් සමන්විත වේ.







# තොරතුරු තාක්ෂණ අංශය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නිරන්තරයෙන් ලෝක තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (WADA) හා ලෝකයේ අනෙකුත් රටවල් සමඟ තොරතුරු සන්නිවේදනය සිදු කරන ආයතනයකි. ඒ සඳහා අවශ්‍ය කාර්යයන් සිදු කිරීමට එම ආයතන තුළ පවතින තාක්ෂණයට අනුව අප ආයතනය සම්බන්ධ කිරීම තුළින් තහනම් උත්තේජක තොරතුරු සන්නිවේදනය කිරීම, මෙම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ ප්‍රධාන අරමුණු අතරින් එකක් වේ.

එහිදී Anti-Doping Administrative System (ADAMS) ලෙස හඳුන්වනු ලබන WADAys තොරතුරු පද්ධතියට අප ආයතනයේ කාලීන තොරතුරු ලබා දීම (ක්‍රීඩකයින් ලියාපදිංචි කිරීම, ගිණුම් සෑදීම, whereabouts ගිණුම් සෑදීම සහ ඒ සම්බන්ධ කාර්යයන්, ක්‍රීඩකයින් පුහුණු කිරීම හා සහය ලබා දීම), Anti-Doping E-Learning (ADeL) පද්ධතිය ක්‍රීඩකයින්ට හඳුන්වා දීම, ක්‍රීඩකයින් ලියාපදිංචි කිරීම හා එහි ඇතුළත් පාඩම් මාලා අප ආයතනයේ අධ්‍යාපන අංශය සඳහා සකස් කර දීම මෙම අංශය මගින් සිදු වේ.

එමෙන් ම ආයතනය තුළ එදිනෙදා පවතින සේවාවන් අඛණ්ඩ ව සිදු කර ගෙන යාම සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දීම ද ප්‍රධාන අරමුණක් වේ. අප ආයතනයේ තොරතුරු, විශේෂ පුවත් මෙන් ම විෂය දැනුම Facebook, Twitter, YouTube යන සමාජ ජාලා තුළින් ද, අප අංශය විසින් ම නිර්මාණය කරනු ලැබූ වෙබ් අඩවිය තුළින් ද සමාජයට ලබා දීමට කටයුතු කරන ලදී. ආයතනික ප්‍රගතිය පිළිබඳ තොරතුරු කාලයානුකූල ව විවිධ අනුබද්ධ ආයතනවලට ඉදිරිපත් කිරීමේ දී එම තොරතුරු ආයතනය තුළ සෑම අංශයකින් ම ලබා ගෙන මාසික කාර්තුමය හා වාර්ෂික වාර්තා ලෙස ඉදිරිපත් කිරීම ද මෙම අංශය මගින් සිදු වේ.

සෑම වර්ෂයක දී ම නිකුත් වන නව තහනම් උත්තේජක ලැයිස්තුවට අනුකූලව අප ආයතනයේ තොරතුරු තාක්ෂණික අංශය විසින්ම Android ස්මාර්ට් දුරකථන සඳහා නිර්මාණය කරනු ලැබූ Drug Reference App හෙවත් DRappys දත්ත පද්ධතිය ද (Database) යාවත්කාලීන කෙරිණි.

ආයතනයෙහි විශේෂ අවස්ථාවල දී අවශ්‍ය ග්‍රැෆික් නිර්මාණ කටයුතු ද මෙම අංශය විසින් ම සිදු කරනු ලැබූ අතර මෙම වර්ෂයේ දී සිදු කරන ලද නිර්මාණවල එකතුවක් පහතින් දක්වා ඇත. ඒවාට පොත් සහ පොත් පිටකවර නිර්මාණ, සමාජ ජාලා පෝස්ට්, අත්පත්‍රිකා, පෝස්ටර්, බැනර්, වීඩියෝ වැනි නිර්මාණ ඇතුළත් වේ.

ආයතනය මගින් නඩත්තු කරනු ලබන Web server ආරක්ෂාව, දත්ත පද්ධති කළමනාකරණය, මෘදුකාංග කළමනාකරණය ඇතුළු තාක්ෂණික සේවාවන් සැපයීම මෙම අංශයේ වගකීම වේ. එමෙන් ම නව මෘදුකාංග ස්ථාපනය කිරීම, මෘදුකාංග දෝෂ නිවැරදි කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම ද ඒවාට ඇතුළත් වේ.

මෙම වර්ෂය තුළ දී නව වෙබ් ව්‍යාපෘති දෙකක් සිදු කරනු ලැබූ අතර එම තොරතුරු පහත පරිදි වේ.

01. ශ්‍රී ලංකාවේ සියලු ම ක්‍රීඩා වෛද්‍ය අංශ, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සමග මාර්ගගත ව සම්බන්ධ කරගැනීම සඳහා එම අංශවලට අනුයුක්ත ක්‍රීඩා වෛද්‍යවරුන්ගේ තොරතුරු පද්ධතියක් ඇතුළත් වෙබ් අඩවියක් නිර්මාණය කිරීම.

    එය VCLC ලෙස හඳුන්වේ.

    පිවිසෙන්න ***https:// slantidoping.org/joinus/***




02. තහනම් උත්තේජක භාවිතය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා අප ආයතනය විසින් හඳුන්වා දුන් ක්‍රමවලින් එකක් වන මාර්ගගත ක්‍රමය සඳහා වෙබ් පෝරමය, දත්ත පද්ධතිය හා පැමිණිලි මෙහෙයවීමේ වෙබ් පද්ධතියක් (Admin Dashboard) නිර්මාණය කරන ලදී.

    පිවිසෙන්න ***https://slantidoping.org/Complaint%20Management%20System/***

### Admin Dashboard

පැමිණෙන අලුත් පැමිණිලි පරීක්ෂා කිරීමටත් එම පැමිණිල්ල වෙනුවෙන් ආයතනය විසින් ගත් ක්‍රියා මාර්ගය සටහන් කර තැබීමටත්, අවශ්‍ය සෑම අවස්ථාවකදීම පසුකාලීන තොරතුරු පරීක්ෂා කිරීමටත්, පැමිණිලි එවූ පුද්ගලයින්ගේ තොරතුරු ලබා ගැනීමටත් Admin Dashboard හරහා පහසුකම් සපයා ඇත.







| Complaint No | complainant Name | Reg Date | Status | Action |
|---|---|---|---|---|
| 1 | | 2021-08-21 05:05:10 | Not process yet | View Details |
| 2 | | 2021-08-21 05:11:38 | Not process yet | View Details |
| 3 | scs | 2021-08-23 02:26:39 | Not process yet | View Details |
| 5 | asa | 2021-09-17 01:14:47 | Not process yet | View Details |
| 6 | [illegible] | 2021-09-17 02:36:38 | Not process yet | View Details |
| 7 | medha uma | 2021-09-17 05:37:24 | Not process yet | View Details |




| # | Name | Email | Contact no | Address | Reg. Date |
|---|---|---|---|---|---|
| 1 | | | | | 2021-08-21 05:05:10 |
| 2 | | | | | 2021-08-21 05:11:38 |
| 3 | scs | scs@gma.com | 710456321 | scs | 2021-08-23 02:26:39 |
| 4 | scs | scs@gma.com | 710456321 | scs | 2021-08-23 02:29:01 |
| 5 | asa | aS@SC.CVX | 0 | asas | 2021-09-17 01:14:47 |

# පරිපාලන අංශය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2021.12.31 දින අනුමත සේවක සංඛ්‍යාව 29කි. එයින් 22දෙදෙනෙකු බඳවා ගෙන රාජකාරි කටයුතු සිදු කරයි.

2021 වසරේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකරන ලදි.

01. සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ)
02. සහකාර අධ්‍යක්ෂ (බලාත්මක කිරීම් හා ක්‍රියාත්මක කිරීම්)
03. සංවර්ධන නිලධාරි (තනතුරු 02)
04. තාක්ෂණ සහකාර (තනතුරු 01)

2021 වසරේ දී අප ආයතනය සඳහා තාක්ෂණ සහකාර (පර්යේෂණාගාර) නමින් තනතුරක් අනුමත වුණි. ඒ සඳහා බඳවා ගැනීම් පරිපාටි සකස් කර අනුමැතියට ඉදිරිපත් කොට 2022 වසරෙහි සුදුසු අයදුම්කරුවෙකු බඳවා ගැනීමට නියමිතයි. 2021 වසර තුළ දී නීති නිලධාරි/ මාණ්ඩලික ලේකම් තනතුර පුරප්පාඩු වූ අතර ඒ සඳහා අයදුම්පත් කැඳවා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ද පැවැත්වුණි. 2022 වසරේ ජනවාරි මාසයේ මෙම තනතුර සඳහා බඳවා ගැනීම් කිරීමට නියමිත ව පවති.

# තිරසාරභාවය පිළිබඳ වාර්තාව



"ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැප වී සිටින අතර, එය ස්වකීය ආයතනික අරමුණු හරහා ශ්‍රී ලාංකීය ක්‍රීඩකයින්ට ක්‍රමයෙන් නියත හා තිරසාර වටිනාකමක් නිර්මාණය කරදෙයි."

පසුගිය දශකයක කාලය තුළ දී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මූලික වශයෙන් ම තිරසාරභාවය පවත්වාගත් ආයතනයකි. ආරම්භයේ සිට ම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හුදෙක් එහි ආසන්නතම පාර්ශවකරුවන්ගේ ශුභසිද්ධියට වඩා වැඩි යමක් සැළකිල්ලට ගනිමින් ක්‍රීඩකයින්ගේ සමස්ත දිගු කාලීන අවශ්‍යතා හා සාරධර්ම සමඟ නොගැටෙන බව සහතික ලෙස විශ්වාස කරයි. මණ්ඩලයේ තිරසාරභාවය පිළිබඳ වාර්තාව එහි පැතිකඩ, තිරසාරභාවය සඳහා වන උපායමාර්ග, ආර්ථික වගකීම, සමාජ වගකීම සහ පාරිසරික වගකීම යන ඒවායින් සමන්විත වේ.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැප වී සිටින අතර එය ස්වකීය අරමුණ ළඟා කර ගැනීම හරහා ක්‍රීඩකයින්ට ක්‍රමයෙන් නියත සහ තිරසාර වටිනාකමක් නිර්මාණය කර දෙයි. මෙම වාර්තාව මගින් සමාජ, පාරිසරික හා ආර්ථික වගවීම පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගෙන ඇති ක්‍රියාමර්ග අවධාරණය කර ඇත. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි සමාජ වගකීමට නියෝජ්‍යායතනයේ, ක්‍රීඩකයන්ගේ සහ ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාව සඳහා ගෙන ඇති වගකීම් සහගත ක්‍රියාමාර්ග ඇතුළත් වේ. පාරිසරික වගකීම සාක්ෂාත් කර ගැනීම පිණිස ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ස්වකීය ආයතනික ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම අධීක්ෂණය කරමින් පරිසර හිතකාමී ආයෝජන සිදු කරයි. ආර්ථික වගකීම, විනිවිදභාවයෙන් යුතු සහ සමබර වන පාලන ආකෘතියක් බවට ප්‍රතිවරණය වෙයි.

## අපගේ මූලික සාරධර්ම

අපගේ කැපවීමෙන් යුතු සහ දැඩි ලෙස උද්යෝගීමත් සේවකයින් සම්බන්ධයෙන් සඳහන් කිරීමේ දී, ඔවුන් අපට අති මහත් සහයෝගයක් ලබා දී ඇත. තමන් ද එහි කොටසක් වීම ගැන ඔවුන්ට ආඩම්බර විය හැකි පරිසරයක් නිර්මාණය කිරීමට අපි මහත් සේ වෙහෙසෙන්නේ එහෙයිනි. අපගේ ශ්‍රම බලකායෙහි විශිෂ්ටත්වය සහ සාර්තකත්වය දිරිගැන්වීම පිණිස පුහුණුව සහ අඛණ්ඩ අධ්‍යාපනය සඳහා අවස්ථා ලබා දීම මගින් අප අපගේ සේවක පිරිස සඳහා ආයෝජනය කරන්නේ අපගේ ආයතනයේ සාර්ථකත්වය රඳා පවතින්නේ තම රැකියාව පිළිබඳ ව ඔවුන්ගේ ඇති තෘප්තිමත්භාවය මත වන බව අපි අවබෝධ කර ගෙන සිටින බැවිනි.

## පාරිසරික වගකීම

පරිසරයට වන බලපෑම අවම කිරීම සඳහා අප විසින් දරන ලද ප්‍රයත්නයන් සාර්ථක වී ඇත. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සේවකයන් සඳහා පරිපූර්ණ පුහුණුව, නව්‍ය තාක්ෂණය සහ පාර්ශවකරුවන් සමග සහයෝගීතාවය හරහා ඵලදායී සහය සේවාවන් සපයා දීමට දොරටුවක් විවර කර දෙයි. App යෙදවුම හඳුන්වා දීම මෙම අරමුණුවලට සාක්ෂි වේ. ඩිජිටල්කරණය හරහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ස්වකීය ක්‍රීඩකයින්ගේ පහසුව උදෙසා වැඩි වැඩියෙන් යෙදවුම් සහ ඊ-සේවා හඳුන්වා දෙමින් පෘථිවිය මත කාබන් පියසටහන අවම කිරීමට ඉලක්ක කරයි. අපි පාරිසරික බලපෑම පිළිබඳ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මෙහෙයුම් වැඩිදියුණු කිරීමට සහ සේවකයින් අතර හරිත දැනුවත්භාවයක්

වැඩි කිරීමට ද අදහස් කරන්නෙමු. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය තිරසාර වටිනාකමක් නිර්මාණය කරමින් කැප වූ සංවර්ධනයක් කෙරෙහි අවධානය යොමු කරයි. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ස්වකීය ආයතනික ව්‍යායාමයන්හි පාරිසරික බලපෑම් අධීක්ෂණය කරන අතර පාරිසරික වගකීම ඉටුකිරීම පිණිස බලශක්තිය ඉතිරි කිරීමේ ආයෝජනය ද සිදු කරයි.

## අපගේ සමාජ වගකීම

අපගේ ආයතනික සමාජ වගකීම් ප්‍රතිපත්ති පදනම් කරගෙන අපව වටිනා ප්‍රජා සාමාජිකයෙකු ලෙස පිළිගනු ලැබීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අපට අවශ්‍ය ය. එම නිසා අර්ථාන්විත, දිගුකාලීන හවුල්කාරිත්වයන් තුළින් ක්‍රීඩකයන්ට සහ ප්‍රජාවට දායකත්වය සපයා දීමට සහ පාරිසරික වශයෙන් තිරසාර ආකාරයකින් ආයතනික කටයුතු කරගෙන යාමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අවධානය යොමු කරයි.

## මානව සම්පත්

යහපත් ව්‍යාපාරික පිළිවෙත් සංවර්ධනය කිරීමේ දී සහ කල් පවත්නා පාරිභෝගික සම්බන්ධතා ගොඩනැගීමේ දී අපගේ සේවකයිනගේ වැදගත් කාර්යභාර්ය අපි පිළිගැනීමට ලක් කරන්නෙමු. අපි අපගේ සේවකයින්ව ඉතා දැඩි ලෙස අගය කරන අතර, ඔවුන් ලබා දෙන ඉතා වටිනා දායකත්වයන් පිළිබඳ අපගේ ඇගයීම පෙන්නුම් කිරීම සඳහා නව්‍ය, සහයෝගී සහ ආකර්ෂණීය සේවා ස්ථානයක් නිර්මාණය කර ලබා දුන්නෙමු.

## කාර්ය මණ්ඩල සංවර්ධනයෙහි අරමුණු

- රැකියා සහ වෘත්තීය අවස්ථා නිර්මාණය කිරීම හා දිරිමත් කිරීම.
- ශ්‍රම බලකාය සැලසුම් කිරීම සහ නිපුණතා කළමනාකරණ වැඩසටහන්, ගුණාත්මක බඳවා ගැනීම් සහ රඳවා ගැනීමේ ක්‍රියාමාර්ග, නායකත්ව සහ අනුප්‍රාප්තික සැලසුම්කරණය සංවර්ධනය කිරීම සහ අඛණ්ඩ අධ්‍යාපනික දැනුම ලබා දීම අඛණ්ඩව වැඩිදියුණු කිරීම.
- අපගේ සේවකයින්ව සවිබල ගන්වනු ලබන බව සහ ඔවුන්ගේ ජයග්‍රහණ සඳහා ඔවුන්ට දිරිගැන්වීම් ලබා දෙනු ලබන බව සහතික කිරීම.
- ආයතනික ක්‍රමෝපායික දිශාව පිළිබඳ ව අපගේ කාර්ය මණ්ඩලය හොඳින් දැනුවත් කර සහ දැන සිටි බව සහතික කිරීම.



# ආයතනික පාලනය

ආයතනික පාලන පද්ධතිය ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය තීරණ ගැනීම සඳහා වන පරිචයන් මහ මගපෙන්වීමේ ප්‍රතිපත්ති නිර්වචනය කර දෙන අතරම, මණ්ඩලයෙහි දිගු කාලීන අරමුණු සහ උපාය මාර්ගික සැලසුම් වලට මග පෙන්වයි. ආයතනික පාලන ආකෘතිය මගින් ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි විවිධ මට්ටම් අතර, විශේෂයෙන් ම පාලනයෙහි මට්ටම් අතර, එනම් අධ්‍යක්ෂ මණ්ඩල සහ විධායක කළමනාකරණ මට්ටම් අතර බලතල සහ වගකීම බෙදී යන ආකාරය සංක්ෂිප්ත ව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනික ප්‍රතිපත්ති ස්ථාපනය කරන අතර, තම ව්‍යාපාරයේ මනා ක්‍රියාකාරිත්වය සඳහා වගකිව යුතු පුද්ගලයින් වන ප්‍රධාන විධායක නිලධාරී සහ විධායක නිලධාරීන්ට ක්‍රමෝපායික මග පෙන්වීමක් සපයා දෙයි.

ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය 2013 අංක 13 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත මගින් පාලනය වේ.එම පනතෙහි 14(i) වගන්තිය මගින් මණ්ඩලයේ ව්‍යුහය පහත සඳහන් පරිදි දක්වා ඇත.

(අ) පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයින්:

i. ක්‍රීඩා විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද ජ්‍යේෂ්ඨ සහකාර ලේකම්වරයාගේ නිලයට වඩා අඩු නොවන ධූරයක් දරන නිලධරිවරයා;

ii. ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

iii. ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

iv. ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා;

(ආ) අමාත්‍යවරයා විසින් පත්කරන ලද නීතිය, ක්‍රීඩා වෛද්‍ය සහ ක්‍රීඩා විද්‍යාව යන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයට පත් වූ (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා පත් කළ යුතු අතර, මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා ද එම සභාපතිවරයා මණ්ඩලයේ කටයුතු පරිපාලන හා කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ ය.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාර්ය

රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල ව අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ කාර්යක්ෂම කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ ය. සියලු ව්‍යවස්ථාපිත හා කළමනාකරණ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල ව වන අතර ම, සම්පත් ආරක්ෂා කිරීම, ප්‍රමාණවත් පරිදි ගිණුම් පවත්වා ගැනීම සහ නිවැරදි වාර්තා සම්පාදනය කිරීම සහතික කරමින් මෙය සාක්ෂාත් කරගත යුතු ය.

එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් දෑ සහතික කළ යුතු ය:

- සංවිධානයේ උපයමාර්ගික අරමුණු ක්‍රියාත්මක ව පවතින බව සහතික කිරීම
- උපයමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්වය ලබා දීම
- ඵලදායී අභ්‍යන්තර පාලනයක් සහ අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක ව වන බවට සහතික කිරීම
- ආයතන කළමනාකරණ කටයුතු ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම
- නිතිපතා වන පදනමකින් අවශ්‍ය කරනු ලබන මූල්‍ය අංග සහ අනාවරණයන් පිළිබඳ ව ප්‍රමාණවත් ලෙස වාර්තා කිරීම
- සම්පත් හා වත්කම් වගකීමෙන් යුතු ව භාවිතා කිරීම
- විගණන කමිටුව සහ අනෙකුත් කමිටු පත් කිරීම; සහ චර්යාධර්ම හා ආචාරධර්ම පද්ධතියක් සහ ආයතනික පාලන උපාය මාර්ගයක් හඳුන්වා දීම
- අදාළ අණ පනත්, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ ආදිය ප්‍රකාර ව ඔවුන්ගේ සියලු ක්‍රියාමාර්ග සඳහා වගකිව යුතු වීම
- අවම වශයෙන් වාර්ෂිකව හෝ ප්‍රධාන විධායක සහ ජ්‍යේෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය පිළිබඳ ඇගයීමක් කිරීම.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

ආයතනික මෙහෙයුම් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ප්‍රතිඵල අයවැය සහ අදාළ ප්‍රමිතීන්ට අනුකූල ව දැඩි ලෙස හා නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සවිස්තරාත්මක ව අවශ්‍ය කරන අනෙකුත් කාරණා සමඟ සම්මත න්‍යාය පත්‍රයක් අනුගමනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් රැස් වන අතර අවශ්‍ය ඕනෑ ම අවස්ථාවක විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබේ.

## SLADA කමිටු

01. විනය මූල මණ්ඩලය

02. අභියාචනා මූල මණ්ඩලය

03. චිකිත්සමය භාවිත මුක්තිය පිළිබඳ කමිටුව (TUE)

04. විගණන සහ කළමනාකරණ කමිටුව

05. ප්‍රසම්පාදන කමිටුව

## කළමනාකාරීත්වය

මණ්ඩලයේ එදිනෙදා මෙහෙයුම් කටයුතු ප්‍රධාන විධායක නිලධාරීගේ හා ඉහළ කළමනාකාරණ සහ ජ්‍යේෂ්ඨ කළමනාකාරණ කණ්ඩායම් වෙත පවරා තිබේ. අවදානම් සහ අවස්ථාවන් හඳුනා ගනු ලබන බව සහ නියමිත වේලාවලට අවශ්‍ය පියවර ගනු ලබන බවත්, ඉලක්ක සපුරා ගැනීම සඳහා අයවැය සකස් කරනු ලබන බවත් එම කණ්ඩායම් විසින් සහතික කරනු ලබයි.

# අවදානම් කළමනාකරණ වාර්තාව

ඵලදායී අවදානම් කළමනාකරණය ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතන ක්‍රියාවලියේ ප්‍රධාන සාධයකයකි. අපගේ ව්‍යාපරයෙහි අවදානම් හා ප්‍රතිඵල අතර උචිත සමතුලිතතාවයක් ඇති කර ගැනීමට සහ පාලිත පරිසරයක් තුළ අපගේ වර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට උපකාරී වන අවදානම් කළමනාකරණ හැකියාවන් අඛණ්ඩ ව වැඩි දියුණු කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු. අවදානම් කළමනාකරණය ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනහි මෙහෙයුම් ව්‍යුහයේ ප්‍රධානතම අංගයක් වේ. මුහුණ දීමට සූදානම් ව සිටින අවදානම් මට්ටම ඇතුළත අවදානම් නිරාවරණය වීම් කළමනාකරණය කිරීම මගින් ඉපැයීම්වල සහ ප්‍රාග්ධනයෙහි අහිතකර විචලනයන් සීමා කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු.

අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම සඳහා වගකීම් සහතික ප්‍රවේශයක් කළමනාකරණ පද්ධතියට ඇතුළත් වේ. අවදානම් දැනුවත් කිරීමේ චර්යාවන්ට සහාය දෙන ශක්තිමත් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ එමගින් අවදානම් මත පදනම් ව තීරණ ගැනීමට අනුබලය දීම අපගේ ප්‍රධාන අවධානය වී තිබේ. ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි දිගුකාලීන තිරසාර බව සහතික කිරීම සඳහා අපි අපගේ අවදානම් උපායමාර්ග තවදුරටත් වැඩිදියුණු කරන්නෙමු.

ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි අවදානම් කළමනාකරණ උපායමාර්ග විශේෂිත පාර්ශවකරුවන්, කළමනාකරුවන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා ප්‍රතිපෝෂණ ක්‍රමවේදයක් ලෙස ක්‍රියාත්මක වේ. ආයතනයේ ව්‍යාපාර, මෙහෙයුම්, පද්ධති සහ සේවාවන් සඳහා දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීමේ උපායමාර්ගික කේන්ද්‍රයක් ලෙස එයට හිමි වන තත්ත්වයෙන් එය සුවිශේෂී වේ. මෙය පහත සඳහන් දෑ හරහා ව්‍යාපාර අවදානම්වලට ආමන්ත්‍රණය කිරීම සඳහා උපායමාර්ගික සහ ව්‍යාපාරික සැලසුම්කරණයට, ව්‍යාපෘති කළමනාකරණයට සහ ව්‍යාපාර ක්‍රියාවලි මට්ටම්වලට ස්ථාවර ප්‍රවේශයක් සපයා දෙයි:

- ව්‍යපාර කාර්යයන් සහ ඒකක පුරා ඇති අවදානම් පිළිබඳ පොදු අවබෝධයක් ලබා දීම.
- වැඩිදියුණු වූ ප්‍රමුඛතා නියම කරගැනීම සහ තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස කළමනාකරණයට අඛණ්ඩ අවදානම් තක්සේරුවක් සපයා දීම.
- සේවක දැනුවත්භාවය සහ කළමනාකරණ වගකීම් වැඩි කිරීම ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පහත සඳහන් කර ඇති පරිදි විශේෂිත අවදානම් සමූහයකට යටත් වේ.

## මූල්‍ය අවදානම

අකාර්යක්ෂම මුදල් ප්‍රවාහ කළමනාකරණය හා මූල්‍ය තොරතුරු සම්බන්ධ අවදානම් මගින් ආයතනවල ඵලදායිතාවයට හානි ගෙන දිය හැකි ය. ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ආයතනය පුරා පිරිවැය පාලන උපාය මාර්ග සම්බන්ධීකරණය කිරීම වැනි මූල්‍ය අවදානම් කළමනාකරණ පිළිවෙත් භාවිතා කරයි.

## මෙහෙයුම් අවදානම

පද්ධති ඇනහිටීම්, පුද්ගලයින් අතින් සිදුවිය හැකි දෝෂ, සාපරාධී ක්‍රියාකාරකම් හෝ අභ්‍යන්තර පද්ධතිමය බිඳවැටීම් හේතුවෙන් සිදුවිය හැකි පාඩු මෙහෙයුම් අවදානම්වලට අයත් වේ. එවැනි තත්ත්වයන් මගින් පාරිභෝගික විශ්වාසයට හා ආයතනික ප්‍රතිරූපයට හානි සිදු විය හැකිය. මෙහෙයුම් අවදානම අවම කිරීම පිණිස ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නිරතුරුව ම අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කරයි. ආයතනික අවදානම මගින් ඇති වන තර්ජනය අවම කිරීම සඳහා ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි කළමනාකාරීත්වය විසින් මෙහෙයුම් ඒකක සහ ව්‍යාපාර ක්‍රියාවලි පිළිබඳ නිරන්තර අවදානම් තක්සේරු කිරීම් සිදු කරනු ලබයි.

## නීති අවදානම

ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට එරෙහිව ගනු ලැබිය හැකි අනාගතම නීතිමය ක්‍රියාමාර්ග වලින් ආරක්ෂා වීමට අපොහොසත් වීම නීතිමය හානි සිදුවීමේ අවදානම වැඩි කරයි. ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පිළිගත් නීති වෘත්තිකයන් උපදෙස් ලබා ගෙන එවැනි ක්‍රියාමාර්ග අවම කිරීම සඳහා සුදුසු පියවර ගෙන තිබේ.

## තොරතුරු තාක්ෂණ අවදානම

තොරුතුරු තාක්ෂණ පද්ධතිය මගින් ලබා ගන්නා නිශ්චිත හා කාලෝචිත තොරුතුරු ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනහි මෙහෙයුම් ක්‍රියාවලියේ මූලික ම අංගයක් වේ. ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ස්වකීය තොරුතුරු තාක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් දියත් කර ඇත.



# විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන අපගේ වාර්තාව අපි සතුටින් ඉදිරිපත් කරන්නෙමු.

## විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනා (03) ගෙන් සමන්විත වේ.

01. එස්.අයි.එම්. රෝසා මයා - සභාපති (අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව)

02. ඩබ්ලිව්.ඒ. කුලසූරිය මයා - සාමාජික (අතිරේක ලේකම්, පාලන, ග්‍රා.පා.ක්‍රී.ය.ප.ප්‍ර.රා. අමාත්‍යාංශය)

03. වෛද්‍ය ලාල් ඒකනායක මයා - සාමාජික (අධ්‍යක්ෂ ජනරාල්, ජා.ක්‍රී. වෛද්‍යායතනය)

අධ්‍යක්ෂ ජනරාල්, ගණකාධිකාරී, පරිපාලන නිලධාරී සහ අනෙකුත් අදාල නිලධාරීන් මෙම රැස්වීම්වලට සහභාගී වීම අනිවාර්ය වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී, එච්. ජූඩ් පෙරේරා මයා සහ ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ප්‍රධාන අභ්‍යන්තර විගණක, ඩී.එච්. කලංසූරිය මිය මෙම කමිටුවේ නිරීක්ෂකයෙකු ලෙස රැස්වීම්වලට සහභාගී වේ.

## විගණන කමිටුවේ කාර්යභාර්ය

පිරිසිදු ක්‍රීඩාවක් ස්ථාපිත කිරීම හා ආයතනය සතු වත්කම් ආරක්ෂා කරගැනීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වාගත යුතු ය. මුදල් අමාත්‍යාංශය සහ අදාළ බලධාරීන් විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ ද කමිටුව විසින් අනුගමනය කරනු ලබයි. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී විගණන කමිටුව විසින් එහි ප්‍රධාන වගකීම්වලට අදාලව සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

01. අනුමත වාර්ෂික විගණන සැළැස්මට අනුකූල ව වරින්වර සිදුකරන ලද අභ්‍යන්තර විගණන පිළිබද කාලීන විගණන වාර්තා අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරනු ලැබේ. මෙම අභ්‍යන්තර විගණන වාර්තා මගින් ආයතනයේ ක්‍රියාත්මක ව පවතින පද්ධති හා ක්‍රියාපටිපාටිවල ඇති අඩුපාඩු අවධාරණය කර පෙන්වා දෙන අතර, නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරු ව අවශ්‍ය අවස්ථාවන් හි පවතින ක්‍රමවේද හා කාර්ය පටිපාටිවල වැඩිදියුණු කිරීම් නිර්දේශ කර, කළමනාකරණ හා විගණන කමිටුවට ප්‍රගතිය වාර්තා කරයි. විගණන කමිටුවට අභ්‍යන්තර විගණනයෙන් නිසිපතා වාර්තා ලැබෙන අතර, එම කාලපරිච්ඡේදය තුළ සිදු කරන ලද එක එක් විගණනය මගින් සොයා ගත් කරුණු පිළිබඳ සාරාංශයක් එම වාර්තාවලට ඇතුළත් වේ. කළමනාකරණයෙහි අදහස් ද එහි කොටසක් වන අතර, විගණනය විසින්

නිරීක්ෂණය කර ඇති තත්වයන්ට හේතු වී ඇති මූලික කරුණු සහ එම තත්වයන්ට හේතු වී ඇති කරුණු සහ එම තත්වයන් නැවත ඇතිවීම වළක්වා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ද කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

02. අභ්‍යන්තර විගණනයේ හා රජයේ විගණනයේ සහය ඇති ව කමිටුව විසින් ආයතනයේ මෙහෙයුම් සහ මූල්‍ය පාලන සහ කාර්යපටිපාටිවල ඵලදායීතාවය තක්සේරු කරනු ලබන අතර, ඒවාට වියදම්, ආදායම් ක්‍රියාවලිය සහ ප්‍රාග්ධන වියදම් සඳහා අවසර දීමේ සීමා, අත්සන් කිරීමේ බලධාරීන්, තොරතුරු තාක්ෂණික යෙදවුම් පාලන හා සංවර්ධනය කිරීම, ආයතනික ව්‍යුහය, ප්‍රතිපත්ති, රාජකාරි වෙන් කර දීම සහ කළමනාකරණය විසින් සිදු කරනු ලබන සමාලෝචන ඇතුළත් වේ. ආයතනයෙහි මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ද්‍රවශීලතා තත්වය නිරන්තරයෙන් නිරීක්ෂණය කරන ලදි. එහි දී හඳුනා ගනු ලබන අඩු පාඩු අවශ්‍ය වැඩිදියුණු කිරීම් සඳහා වන නිර්දේශ ද සහිතව වාර්තා කරනු ලැබේ.

## පවත්වන ලද විගණන කමිටු රැස්වීම් ගණන

2021 වර්ෂය සඳහා රැස්වීම් තුනක් (03) පවත්වන ලද අතර ඒ සඳහා පැමිණීම පහත පරිදි වේ.

| විගණන කමිටුව | පැමිණීම | නොපැමිණීම |
|---|---|---|
| එස්.අයි.එම්. රෝසා මයා | 3/3 | නැත |
| ඩබ්ලිව්.ඒ. කුලසූරිය මයා | 3/3 | නැත |
| වෛද්‍ය ලාල් ඒකනායක මයා | 2/3 | 1 |
| එච්. ජූඩ් පෙරේරා මයා | 3/3 | නැත |
| ඩී.එච්. කලංසූරිය මිය | 2/2 | නැත |



**එස්.අයි.එම්. රෝසා**
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව



# මූල්‍ය වාර්තාව



- මූල්‍ය තත්ව ප්‍රකාශය
- විස්තීරණ ආදායම් ප්‍රකාශය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය
- හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය
- ගිණුම්කරණ ප්‍රතිපත්ති
- අවසාන ගිණුම් සඳහා සටහන්
- ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව
- කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**
**මූල්‍ය තත්ව ප්‍රකාශය**

| ශේෂය | සටහන | 2021 දෙසැම්බර් 31 | * සංශෝධිත 2020 දෙසැම්බර් 31 |
|---|---|---|---|
| | | (ශ්‍රී ලංකා රුපියල්) | |
| වත්කම් | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත සහ උපකරණ | 1 | 210,455,133.22 | 225,864,722.09 |
| කාරක ප්‍රාග්ධන ප්‍රගතිය | 2 | 60,211,400.00 | 60,211,400.00 |
| | | **270,666,533.22** | **286,076,122.09** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 3 | 2,005,580.20 | 1,805,639.63 |
| අයවිය යුතු දෑ | 4 | 1,296,100.00 | 691,040.00 |
| කලින් ගෙවූ වියදම් | 5 | 384,224.03 | - |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 6 | 3,750,780.96 | 2,166,789.93 |
| | | **7,436,685.19** | **4,663,469.56** |
| **මුළු වත්කම්** | | **278,103,218.41** | **290,739,591.65** |
| අරමුදල් හා වගකීම් | | | |
| **මූල්‍යනය කළේ:** | | | |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | 7 | 251,811,034.63 | 266,229,421.89 |
| අමාත්‍යාංශ ප්‍රතිපාදන | 8 | 1,445,090.38 | 2,198,212.88 |
| සමුච්ත අරමුදල | 9 | 6,314,053.91 | 4,465,033.91 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 10 | 2,547,085.96 | 2,547,085.96 |
| | | **262,117,264.88** | **275,439,754.64** |
| **ජංගම වගකීම්** | | | |
| රඳවාගත් මුදල් | 11 | 12,300,559.94 | 12,300,559.94 |
| උපචිත වියදම් | 12 | 1,228,036.09 | 1,194,630.66 |
| ආපසු ගෙවියයුතු තැම්පතු | | 40,000.00 | 85,000.00 |
| පාරිතෝෂිත වෙන් කිරීම් | 13 | 2,417,357.50 | 1,719,646.41 |
| | | **15,985,953.53** | **15,299,837.01** |
| | | **278,103,218.41** | **290,739,591.65** |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලද්දේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ රාජ්‍ය අංශයේ ගිණුම් කරන ප්‍රමිතීන්ට අනුකූලවය.

**ඒච්.ඒම්.සි.පී.දායාරත්න**
ගණකාධිකාරී

**වෛද්‍ය සීවලී ජයවික්‍රම**
අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබමි.

**ඩබ්ලිව්.ඒ. කුලසූරිය**
අධ්‍යක්ෂ

**මහාචාර්ය අර්ජුන ද සිල්වා**
සභාපති

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**

**දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**

**විස්තීරණ ආදායම් ප්‍රකාශය**

* සංශෝධිත

| | සටහන | 2021 | 2020 |
|---|---|---|---|
| | | (ශ්‍රී ලංකා රුපියල්) | |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | 7 | 64,474,387.26 | 56,562,628.27 |
| අමාත්‍යාංශ ප්‍රතිපාදන | 8 | 753,122.50 | 753,122.50 |
| වෙනත් ආදායම් | 14 | 1,849,020.00 | 2,927,395.91 |
| **මුළු ආදායම්** | | 67,076,529.76 | 60,243,146.68 |
| පරිපාලන වියදම් | 15 | (65,227,509.76) | (57,315,750.77) |
| **ශුද්ධ අතිරික්තය/( හිඟය)** | | **1,849,020.00** | **2,927,395.91** |

## ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
## දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

* සංශෝධිත

| | සටහන | 2021 | 2020 |
|---|---|---|---|
| | | (ශ්‍රී ලංකා රුපියල්) | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහයන්** | | | |
| ශුද්ධ ලාභය | | 1,849,020.00 | 2,927,395.91 |
| **ගැලපීම්** | | | |
| ක්ෂය | | 17,511,392.06 | 17,022,491.22 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම් | 7 | (64,474,387.26) | (56,562,628.27) |
| | | **(45,113,975.20)** | **(36,612,741.15)** |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීම්** | | | |
| (වැඩි කිරීම්)/අඩු කිරීම් තොගය | | (199,940.57) | 212,949.37 |
| (වැඩි කිරීම්)/අඩු කිරීම් අයවිය යුතු පරීක්ෂණ ගාස්තු | | (605,060.00) | (691,040.00) |
| (වැඩි කිරීම්)/අඩු කිරීම් කලින් ගෙවූ වියදම් | | (384,224.03) | - |
| වැඩි කිරීම්/ (අඩු කිරීම්) යලි ගෙවන රැඳවුම් මුදල් | | (45,000.00) | 50,000.00 |
| වැඩි කිරීම්/ (අඩු කිරීම්) පාරිතෝෂික වෙන් කිරීම් | 13 | 697,711.09 | (91,877.47) |
| වැඩි කිරීම්/(අඩු කිරීම්) රැඳවුම් මුදල් | | - | 6,626,927.74 |
| වැඩි කිරීම්/(අඩු කිරීම්) උපචිත වියදම් | | 33,405.43 | 429,702.49 |
| | | **(503,108.08)** | **6,536,662.13** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල්** | | **(45,617,083.28)** | **(30,076,079.01)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහ** | | | |
| දේපල පිරියත උපකරණ මිලදී ගැනීම් | | (2,101,803.19) | (31,809,152.86) |
| කාරක ප්‍රාග්ධන ප්‍රගතිය | | - | 5,057,391.03 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන පියවීම | | - | (15,000,000.00) |
| | | **(2,101,803.19)** | **(41,751,761.83)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | | |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | | 50,056,000.00 | 71,711,000.00 |
| ලේකම් - ක්‍රීඩා අමාත්‍යාංශය | | (753,122.50) | (753,122.50) |
| | | **49,302,877.50** | **70,957,877.50** |
| **වර්ෂය තුළදී මෙහෙයුම් තුළින් ජනිත වූ ශුද්ධ ලාභය (ප්‍රයෝජනයට ගන්නා ලද)** | | **1,583,991.03** | **(869,963.34)** |
| **වර්ෂ ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ** | | **2,166,789.93** | **2,933,415.77** |
| **වර්ෂ අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ** | | **3,750,780.96** | **2,063,452.43** |

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**

**2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**

**හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය**

(ශ්‍රී ලංකා රුපියල්)

| | ප්‍රත්‍යාගණන සංචිතය රු. | සමුච්ත ලාභය රු. | මුළු අගය රු. |
|---|---|---|---|
| 2015 ජනවාරි 01 දිනට ශේෂය | - | 110,540.00 | 110,540.00 |
| වර්ෂයේ ශුද්ධ ලාභය | - | 94,999.91 | 94,999.91 |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | **205,539.91** | **205,539.91** |
| වර්ෂයේ ශුද්ධ ලාභය | - | 155,063.00 | 155,063.00 |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | **360,602.91** | **360,602.91** |
| වර්ෂයේ ශුද්ධ ලාභය | - | 29,800.00 | 29,800.00 |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | **390,402.91** | **390,402.91** |
| වර්ෂයේ ශුද්ධ ලාභය | - | 429,424.00 | 429,424.00 |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | **819,826.91** | **819,826.91** |
| වර්ෂයේ ශුද්ධ ලාභය | - | 717,811.00 | 717,811.00 |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | **1,537,637.91** | **1,537,637.91** |
| වර්ෂයේ ශුද්ධ ලාභය | - | 2,927,395.91 | 2,927,395.91 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 2,547,085.96 | - | 2,547,085.96 |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **2,547,085.96** | **4,465,033.82** | **7,012,119.78** |
| දෝෂ නිවැරදි කිරීම මත ගැලපීම (සටහන 13) * | - | (103,337.50) | (103,337.50) |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය-සංශෝධිත** | **2,547,085.96** | **4,361,696.32** | **6,908,782.28** |
| වර්ෂයේ ශුද්ධ ලාභය | | 1,849,020.00 | 1,849,020.00 |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **2,547,085.96** | **6,210,716.32** | **8,757,802.28** |

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**

**2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්**

## 1. වාර්ථා කිරීමේ ආස්ථිත්‍යය

### 1.1. පොදු

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය 2013 නොවැම්බර් මස 11 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද 2013 අංක 33 දරන උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතට අනුව ස්ථාපිත කරන ලදී. මෙම ආයතනයේ ලියාපදිංචි කාර්යාලය අංක 363/12, සුගතදාස ස්ටේඩියම් - බ්ලොක් ඩී, ස්ටේඩියම් රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14 යන ලිපිනයේ පිහිටුවා ඇත.

#### 1.1.1. ආයතනයේ අරමුණු

අ) ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීම පිටුදැකීම සඳහා අවශ්‍ය වන යම් පියවර ගැනීම.

ආ) ක්‍රීඩාවලට සම්බන්ධ උත්තේජක ගැනීම සම්බන්ධ ක්ෂේත්‍ර හා අදාළ පර්යේෂණ සහ නියෝජ්‍යායතනය සහ සමාන කර්තව්‍ය ඉටු කරනු ලබන වෙනත් අන්තර්ජාතික සංවිධාන අතර අන්‍යොන්‍ය පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම.

#### 1.1.2. ප්‍රකාශණ අනුකූලතාවය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ ගිණුම් සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලවය.

#### 1.1.3. සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ ඓතිහාසික පිරිවැය පදනම යටතේය. මෙහිදී උද්ධමනීය සාධක සැලකිල්ලට ගනු නොලබයි.

#### 1.1.4. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසුව වියහැකි ප්‍රධාන ප්‍රතිවිපාක සඳහා අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල හා ගිණුම් වල අනාවරණය කරනු ලබයි.

### 1.2. වත්කම් සහ අගය කිරීමේ පදනම

වර්ෂයක් තුළ මුදල් සහ බැංකු ශේෂය සහ මුදල් වලට පරිවර්ථනය කළ හැකි අයිතම සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ ජංගම වත්කම් ලෙස හදුනාගෙන ශේෂ පත්‍රයේ විස්තර කර ඇත.

#### 1.2.1. වත්කම්

දේපල පිරියත සහ උපකරණ වල අගය දක්වා ඇත්තේ සමුච්ත ක්ෂය අඩු කිරීමෙන් පසුවය.

#### 1.2.2. ක්ෂය

ක්ෂය ප්‍රතිපත්තිය සිදු කර ඇත්තේ සරළ මාර්ග ක්‍රමයටය. ක්ෂය කරනු ලබන්නේ වත්කම් අත්පත් කරගත් වර්ෂයේ සිට හෝ අදාළ වත්කමේ ඉදිකිරීම් කටයුතු අවසන් වු වර්ෂයේ සිටය. වත්කමේ අපේක්ෂිත ඵලදායී ජීවකාලය තුළ ආදායම් සහ වියදම් ගිණුමෙන් ක්ෂය කපා හැරීම.

| | |
|---|---|
| පරිඝණක සහ උපකරණ | 25% |
| ගෘහ උපකරණ | 10% |
| වෙනත් උපකරණ | 25% |
| මෝටර් වාහන | 12.5% |
| පර්යේෂණ උපකරණ | 25% |
| රසායනාගාර ගෘහ උපකරණ | 10% |
| ගොඩනැගිලි | 5% |

#### 1.2.3. ප්‍රත්‍යාගණනය

සෑම වර්ෂ හතරකටම වරක් සුදුසුකම් සහිත පුද්ගලයින් විසින් පරිඝණක සහ උපකරණ හා වෙනත් උපකරණ සඳහා ප්‍රත්‍යාගණනය සිදුකරනු ලබයි. ප්‍රත්‍යාගණන අතිරික්තය වත්කමෙහි දළ ධාරණ අගය මත හඳුනාගෙන එහි ප්‍රත්‍යාගණන වටිනාකම ප්‍රත්‍යාගණන සංචිතයකට මාරු කරනු ලබයි.

#### 1.2.4. තොග

වසර අවසාන තොගය ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 9, ඡේද 16 ට අනුකූලව තක්සේරු කර ඇති අතර, හුවමාරු නොවන ගනුදෙනුවක් මාර්ගයෙන් තොග අත්පත් කරගත් අවස්තාවලදී ඒවායේ පිරිවැය ඒවා අත්පත් කරගත් දින පැවති සාධාරණ අගයට මනිනු ලැබේ. තොගවල සාධාරණ අගය/ ගැනුම් පිරිවැය (අ) ගැනුම් මිල, (ආ) ආනයන තීරු බදු සහ අනෙකුත් බදු සහ (ඇ) ප්‍රවාහන වියදම් හා පරිහරණ ගාස්තු සහ නිමි භාණ්ඩ අත්පත් කර ගැනීම සඳහා සෘජුවම අදාල වන අනෙකුත් පිරිවැය වලින් සමන්විතවේ.

ආයතනයේ තොග පහත පරිදි වේ.

- මානව සාම්පල් කට්ටල
- අශ්ව සාම්පල් කට්ටල
- ලිපිද්‍රව්‍ය
- ටෝනර් සහ කාට්රිජ්

1.3. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හඳුනාගත් සියළුම වගකීම් ගිණුම්ගත කර ඇත. ශේෂපත්‍ර දින සිට වර්ෂයක් තුළ ගෙවිය හැකි හෝ ඉල්ලීමක් මත ගෙවිය හැකි වගකීම් ජංගම වගකීම් ලෙස ශේෂ පත්‍රයේ හඳුනාගෙන ඇත. ගෙවීම සඳහා වර්ෂයකට වැඩි කාලයක් ගත වන වගකීම් ජංගම නොවන වගකීම් වේ.

### 1.3.1. සේවකයන්ගේ හිමිකම්

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා දායකත්වය මූල්‍ය ප්‍රකාශනයේ වියදම් ලෙස හඳුනාගෙන ඇත.

### 1.3.2. සේවකයන් සඳහා  විශ්‍රාම පාරිතෝෂිත

සෑම සේවකයෙකු සේවයෙහි යෙදී පළමු වර්ෂය අවසන් වූ පසුව විශ්‍රාම පාරිතෝෂික වෙන් කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත. 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීමේ පනතට අනුව මෙය සිදු කරනු ලබයි. සෑම වර්ෂයකම දෙසැම්බර් මස අවසාන දිනට ඇති කාර්යය මණ්ඩලයේ දළ වැටුපෙන් භාගයක් පාරිතෝෂිත සඳහා වෙන් කරනු ලබයි. කෙසේ වෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීමේ පනතට අනුව මෙම ගෙවීම සිදු කරනු ලබන්නේ වසර 5 ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කරන ලද සේවකයින්ට පමණි.

## 1.4. ආදායම් ප්‍රකාශය

### 1.4.1. ආදායම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය  මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලවය අදාළ සේවාව ලබා දීමෙන් පසුව උපචිත පදනම මත ආදායම හඳුනාගනී.

### 1.4.2. වියදම්

වියදම් පිළිබඳ විස්තරයෙහි ලාභය හෝ අලාභය හඳුනාගන්නේ බදු අයකිරීමට පෙර හා හඳුනාගත් සියළු වගකීම් සඳහා වෙන්කිරීමෙන් පසුවය.

වත්කම් නඩත්තු කිරීමේ හා ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ දී දැරීමට වන වියදම් ශුද්ධ ඌනතාවය හෝ අතිරික්තය ගණනය කිරීමේ දී ආදායම් පිළිබඳ විස්තර වල ගලපනු ඇත. දුරකතන වියදම්, විදුලි වියදම් හා ජල බිල්පත් එම පහසුකම් සඳහා හිමිකම් කියන නිළධාරීන් හා සේවකයවන්ගෙන් අයකරනු ලබයි. එම වියදම් අදාල තීරු හි විස්තර කරනු ලබයි.

### 1.4.3. ප්‍රතිපාදන

ප්‍රතිපාදන හා ආධාර අදාල වියදම් සඳහා ගැලපෙන අයුරින් සකස් කර ඇත. වත්කම් හා සම්බන්ධ මූල්‍ය නොවන ප්‍රතිපාදන, මූල්‍ය වටිනාකම මත ගිණුම්ගත කල යුතු අතර එම වත්කම් ආදායම් ප්‍රකාශයේ වත්කමේ ඵලදායි ජීව කාලය තුල කපා හරිනු ඇත.

### 1.4.4. අනෙකුත් ප්‍රතිපාදන

අනෙකුත් ප්‍රතිපාදන සහ ආධාර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස ගිණුම්ගත කල යුතු අතර, වැඩසටහන අවසානයේ ඇති යම් මුදලක් තිබේ නම්, එය වෙනත් ආදායමක් ලෙස ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

## 1.5. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

### 1.5.1. මුදල්

අතැති මුදල් හා ඉහළ ද්‍රවශීලතාවක් සහිත කිසිදු අවධානමකින් තොරව පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි වත්කම් මුදල් ලෙස හඳුනා ගනී. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවශ්‍යතාවය මත අතැති මුදල් හා බැංකු මුදල්, මුදල් ලෙස හඳුනා ගැනේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනුයේ වක්‍ර පදනමටය.

### 1.5.2. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසුව වියහැකි ප්‍රධාන ප්‍රතිවිපාක සඳහා අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල හා ගිණුම් වල අනාවරණය කරනු ලබයි.

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**
**දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්**

**සටහන-01**
**දේපල පිරියත සහ උපකරණ**
**(ශ්‍රී ලංකා රුපියල්)**

| පිරිවැය/ ප්‍රත්‍යාගණිත | * සංශෝධිත 2021.01.01 දිනට ශේෂය | ප්‍රවර්ථන වර්ෂයේ එකතු කිරීම් | 2021.12.31 දිනට ශේෂය |
|---|---|---|---|
| ගොඩනැගිලි සහ සැලසුම් | 216,678,822.95 | 307,215.09 | 216,986,038.04 |
| ගෘහ භාණ්ඩ | 873,436.35 | - | 873,436.35 |
| පරිගණක සහ උපකරණ | 1,255,850.00 | 1,483,930.00 | 2,739,780.00 |
| වෙනත් උපකරණ | 2,329,650.00 | 21,000.00 | 2,350,650.00 |
| රථ වාහන -WPLW - 0353 | 6,024,980.00 | - | 6,024,980.00 |
| පර්යේෂණ උපකරණ | 11,155,842.25 | 289,658.10 | 11,445,500.35 |
| රසායනාගාර ගෘහ උපකරණ | 16,876,414.30 | - | 16,876,414.30 |
| | **255,194,995.85** | **2,101,803.19** | **257,296,799.04** |

| සමුච්ත ක්ෂය | * සංශෝධිත 2021.01.01 දිනට ශේෂය | ප්‍රවර්ථන වර්ෂයේ එකතු කිරීම් | 2021.12.31 දිනට ශේෂය |
|---|---|---|---|
| ගොඩනැගිලි සහ සැලසුම් | 21,481,043.86 | 10,849,301.90 | 32,330,345.76 |
| ගෘහ භාණ්ඩ | 518,729.28 | 87,343.64 | 606,072.92 |
| පරිගණක සහ උපකරණ | - | 684,945.00 | 684,945.00 |
| වෙනත් උපකරණ | - | 587,662.50 | 587,662.50 |
| රථ වාහන -WPLW - 0353 | 2,763,934.63 | 753,122.50 | 3,517,057.13 |
| පර්යේෂණ උපකරණ | 2,878,924.56 | 2,861,375.09 | 5,740,299.65 |
| රසායනාගාර ගෘහ උපකරණ | 1,687,641.43 | 1,687,641.43 | 3,375,282.86 |
| | **29,330,273.76** | **17,511,392.06** | **46,841,665.82** |
| | | | |
| 2021.12.31 දිනට ලේඛණගත අගය | **225,864,722.09** | **(15,409,588.87)** | **210,455,133.22** |

## ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
## දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

(ශ්‍රී ලංකා රුපියල්)

* සංශෝධිත

| | 2021 | 2020 |
|---|---|---|
| **සටහන-02** | | |
| **කාරක ප්‍රාග්ධන ප්‍රගතිය** | | |
| පර්යේෂණ උපකරණ | 60,211,400.00 | 60,211,400.00 |
| | **60,211,400.00** | **60,211,400.00** |

LC-MS/MS යන්ත්‍රය මිලදී ගැනීමේදී දරන ලද වියදම් ප්‍රාග්ධන වියදමෙහි ප්‍රගතියෙන් නිරූපනය කරනු ලබයි. පර්යේෂණ ඒකකය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක අවස්තාවේදී ප්‍රාග්ධන වියදමෙහි ප්‍රගතිය අදාළ වත්කම් ගිණුමට මාරු කරනු ලැබේ.

| | 2021 | 2020 |
|---|---|---|
| **සටහන-03** | | |
| **තොග** | | |
| අවසන් තොගය - මානව සාම්පල් කට්ටල | 1,489,540.00 | 1,054,576.13 |
| අවසන් තොගය - අශ්ව සාම්පල් කට්ටල | - | 115,710.00 |
| අවසන් තොගය - ලිපිද්‍රව්‍ය | 236,220.00 | 635,353.50 |
| අවසන් තොගය - ටෝනර් සහ කාට්රිජ් | 279,820.20 | - |
| | **2,005,580.20** | **1,805,639.63** |
| **සටහන-04** | | |
| **අයවියයුතු දෑ** | | |
| පරීක්ෂණ ආදායම් - ශ්‍රී ලංකා ක්‍රිකට් මණ්ඩලය | 672,000.00 | 691,040.00 |
| පරීක්ෂණ ආදායම් - රෝයල් ටර්ෆ් ක්ලබ් | 624,100.00 | - |
| | **1,296,100.00** | **691,040.00** |
| **සටහන-05** | | |
| **කලින් ගෙවූ වියදම්** | | |
| ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් (පුද්) සමාගම | 4,864.70 | - |
| මෙට්‍රොපොලිටන් ඔෆිස් (පුද්) සමාගම | 2,880.00 | - |
| ඔෆිස්ට්‍රොනික්ස් (පුද්) සමාගම | 7,083.33 | - |
| හේලීස් ඇවෙන්චුරා (පුද්) සමාගම | 132,525.00 | - |
| ජෝර්ජ් ස්ටුවර්ට් සොලූශන්ස් (පුද්) සමාගම | 140,481.00 | - |
| ඇමීගෝ ටෙක්නොලොජීස් (පුද්) සමාගම | 96,390.00 | - |
| | **384,224.03** | - |
| **සටහන-06** | | |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ** | | |
| ලංකා බැංකුව - ගිණුම් අංක 75463697 | 3,750,780.96 | 2,166,789.93 |
| | **3,750,780.96** | **2,166,789.93** |
| **සටහන-07** | | |
| **භාණ්ඩාගාර ප්‍රතිපාදන** | | |
| 2021.01.01 දිනට ශේෂය | 266,229,421.89 | 266,081,050.16 |
| ගලා ඒම් - 2021 | 50,056,000.00 | 71,711,000.00 |
| අරමුදල් ක්‍රමක්ෂය 2021 | (64,474,387.26) | (56,562,628.27) |
| භාණ්ඩාගාරට පියවීම | - | (15,000,000.00) |
| 2021.12.31 දිනට ශේෂය | **251,811,034.63** | **266,229,421.89** |

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය**
**දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්**

(ශ්‍රී ලංකා රුපියල්)
* සංශෝධිත

| | 2021 | 2020 |
|---|---|---|
| **සටහන-08** | | |
| **අමාත්‍යාංශ ප්‍රතිපාදන** | | |
| 2021.01.01 දිනට ශේෂය | 2,198,212.88 | 2,951,335.38 |
| අරමුදල් ක්‍රමක්ෂය 2021 | (753,122.50) | (753,122.50) |
| 2021.12.31 දිනට ශේෂය | **1,445,090.38** | **2,198,212.88** |
| **සටහන-09** | | |
| **සමුච්ත අරමුදල** | | |
| ආරම්භක වර්ෂයේ ශේෂය | 4,465,033.91 | 1,537,638.00 |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා ලාභය මාරු කිරීම | 1,849,020.00 | 2,927,395.91 |
| වර්ෂ අවසානයේ ශේෂය | **6,314,053.91** | **4,465,033.91** |
| **සටහන-10** | | |
| **ප්‍රත්‍යාගණන සංචිත** | | |
| ප්‍රත්‍යාගණන සංචිත | 2,547,085.96 | 2,547,085.96 |
| වර්ෂ අවසානයේ ශේෂය | **2,547,085.96** | **2,547,085.96** |
| **සටහන-11** | | |
| **රැඳවුම් ගිණුම්** | | |
| ජෝර්ජ් ස්ටුවර්ට් ඉංජිනියරින් (පුද්) සමාගම | 2,549,144.14 | 2,549,144.14 |
| ඇනලටිකල් ඉන්ස්ටෲමන්ට්ස් | 472,915.80 | 472,915.80 |
| හේලීස් ලයිෆ් සයන්ස් (පුද්) සමාගම | 9,278,500.00 | 9,278,500.00 |
| | **12,300,559.94** | **12,300,559.94** |
| **සටහන-12** | | |
| **උපචිත වියදම්** | | |
| තැපල් සහ සන්නිවේදන | 32,939.62 | 83,003.78 |
| විදුලිය සහ ජල වියදම් | 225,776.06 | 170,091.90 |
| මෙහෙයුම් කල්බදු - ලීසිං කුලිය | 216,000.00 | 216,000.00 |
| වැටුප් හා වේතන | - | 5,000.00 |
| අතිකාල දීමනා වියදම් | 63,561.33 | 74,798.55 |
| ප්‍රවාහන වියදම් | 88,000.00 | 151,220.00 |
| ආරක්ෂක සේවා | 192,014.00 | 190,814.00 |
| පවිත්‍රතා සහ සනීපාරක්ෂක සේවා | 150,050.00 | 23,147.73 |
| විගණන ගාස්තු | - | 117,600.00 |
| තහනම් උත්තේජක පරීක්ෂණ වියදම් | 69,458.48 | 162,954.70 |
| ගොඩනැගිලි සහ සැලසුම් නඩත්තු වියදම් | 33,480.00 | - |
| යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් | 156,756.60 | - |
| | **1,228,036.09** | **1,194,630.66** |

## ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
## දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

(ශ්‍රී ලංකා රුපියල්)

* සංශෝධිත

| | 2021 | 2020 |
|---|---|---|
| **සටහන-13** | | |
| **පාරිතෝෂිත වෙන් කිරීම්** | | |
| වර්ෂය ආරම්භයේ වෙන් කිරීම | 1,719,646.41 | 1,708,186.38 |
| වසර සඳහා පාරිතෝෂිත ගෙවීම | - | (103,337.50) |
| වර්ෂයේ වෙන් කිරීම | 697,711.09 | 114,797.53 |
| වර්ෂ අවසානයේ වෙන් කිරීම | **2,417,357.50** | **1,719,646.41** |

පාරිතෝෂිත වෙන් කිරීම පසුගිය වසරේ අඩුවෙන් වාර්තා වී ඇති බැවින් එම ගිණුම සංශෝධනය කරන ලදී

| | 2021 | 2020 |
|---|---|---|
| **සටහන-14** | | |
| **වෙනත් ආදායම්** | | |
| උත්තේජක පරීක්ෂණ ආදායම් | 1,781,520.00 | 2,738,253.71 |
| යලි නොගෙවන තැම්පතු | - | 19,000.00 |
| කුලී ආදායම් | 67,500.00 | 67,500.00 |
| වෙනත් ආදායම් | - | 102,642.20 |
| | **1,849,020.00** | **2,927,395.91** |
| **සටහන-15** | | |
| **පරිපාලන වියදම්** | | |
| වැටුප් හා වේතන | 12,209,450.24 | 10,470,508.38 |
| සභාපතිතුමාගේ දීමනා | 450,000.00 | 409,913.79 |
| අතිකාල සහ නිවාඩු දින ගෙවීම් | 546,318.66 | 442,697.25 |
| සේවක අර්ථසාධක අරමුදල | 1,393,945.95 | 1,223,474.93 |
| සේවක නියුක්තිකයේ භාරකාර අරමුදල | 348,486.48 | 305,868.73 |
| ගෘහස්ථ, ප්‍රවාහන සහ ඉන්ධන දීමනා | 600,000.00 | 600,000.00 |
| විදේශීය ගමන් වියදම් | - | 21,860.00 |
| ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල උපකරණ | 1,169,828.02 | (207,694.49) |
| ඉන්ධන | 963,950.00 | 821,863.00 |
| වාහන නඩත්තු වියදම් | 105,550.67 | 195,112.21 |
| ගොඩනැගිලි සහ සැලසුම් නඩත්තු වියදම් | 770,948.36 | 357,918.00 |
| යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් | 782,236.51 | 637,902.28 |
| ප්‍රවාහන | 1,066,840.00 | 1,115,445.00 |
| මෙහෙයුම් කල්බදු සඳහා ගෙවීම් | 2,592,000.00 | 2,592,000.00 |
| තැපල් සහ සන්නිවේදන | 381,823.32 | 907,068.69 |
| විදුලිය සහ ජලය | 2,688,411.81 | 1,802,086.45 |
| තහනම් උත්තේජක පරීක්ෂණ ගාස්තු | 9,350,323.03 | 11,521,640.07 |
| ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය | 1,785,768.40 | 982,448.00 |
| පුහුණු සහ රැස්වීම් වියදම් | 996,275.14 | 679,034.00 |
| සාමාජිකත්වය අළුත් කර ගැනීමේ වියදම් | 2,869,043.03 | 304,688.80 |
| විගණන ගාස්තු | - | 512,880.00 |
| අලෙවිකරණ සහ පර්යේෂණ වියදම් | 110,000.00 | 464,780.92 |
| දැනුවත් කිරීමේ වැඩමුළු | 296,088.76 | 510,541.36 |
| ධාරිතාව වර්ධන | 79,240.00 | 91,350.00 |
| ක්ෂය වීම් | 17,511,392.06 | 17,022,491.22 |
| පාරිතෝෂිත වෙන් කිරීම් | 697,711.09 | 114,797.53 |
| පවිත්‍රතා සහ සනීපාරක්ෂක සේවා | 1,537,598.76 | 1,334,770.65 |
| ආරක්ෂක සේවා | 2,247,913.00 | 2,080,304.00 |
| පර්යේෂණ හා සංවර්ධන | 298,557.45 | - |
| නීතිමය සහ බලාත්මක කිරීමේ වියදම් | 321,333.00 | - |
| පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ වියදම්-ගොඩනැගිලි සහ සැලසුම් | 263,304.00 | - |
| පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ වියදම්-වාහන | 793,172.02 | - |
| | **65,227,509.76** | **57,315,750.77** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.: එස්වයිඒ/ඒ/එස්එල්ඒඩීඒ/06/21/06
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2022 අගෝස්තු 10 දින

සභාපති
ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 30 වගන්තිය සහ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර්31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන නියෝජ්‍යායතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

නියෝජ්‍යායතනයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

පිටුව 2 | 7

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය නියෝජ්‍යායතනයේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, නියෝජ්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

සිවුව 3 | 7

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

පිටුව 4 | 7

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

**2.1.1** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා නියෝජ්‍යායතනයේ පවත්වාගෙන ගොස් තිබුණි.

**2.1.2** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

**2.1.3** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

**2.2.1** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට නියෝජ්‍යායතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

**2.2.2** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

**2.2.3** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**2.2.4** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

**2.3** **වෙනත් කරුණු**

(අ) ශ්‍රී ලංකාවේ සිදු කරන උත්තේජක පරීක්ෂාවන් ජාත්‍යන්තර මට්ටමින් පවත්වා ගැනීම මෙන්ම දේශීය ආයුර්වේද ඖෂධ හා ආහාර පාන වල අන්තර්ගතය හා ඒවායේ තහනම් ද්‍රව්‍ය අඩංගු විය හැකිද යන්න සොයා බැලීම අරමුණු කොට නියෝජ්‍යායතනයේ පර්යේෂණ ඒකකයක් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 101 ක (බදු සහිත) මුදල රජයේ ඒකාබද්ධ අරමුදලින් වෙන් කර ගැනීමට සහ එම ප්‍රතිපාදන 2019 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන යටතේ ලබා දීමට 2018 සැප්තැම්බර් 18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදනය සිදු කරනු ලැබීමෙන් පසු 2020 මාර්තු 15 දින වන විට නියෝජ්‍යායතනය වෙත ලැබී තිබූ මෙම පර්යේෂණ උපකරණ 2020 අප්‍රේල් 05 දින වන විට ස්ථාපිත කල යුතුව පැවතුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ තුළ නොනිමි ප්‍රාග්ධන වැඩ යටතේ රු.60,211,400 ක් වූ පිරිවැය ලෙස දක්වා තිබූ මෙම පර්යේෂණ උපකරණ භාවිතයට අවශ්‍ය පුහුණුවීම් හා පර්යේෂණ කටයුතු වලට අවශ්‍ය විශේෂඥ සේවා ලබා ගැනීම් ප්‍රමාද වීම හේතුවෙන් සහ උපකරණ නිවැරදිව ක්‍රියාත්මක වන බවට විශේෂඥ පරික්ෂණ වාර්තා නොගැනීම හේතුවෙන් පර්යේෂණාගාරයේ කටයුතු ප්‍රමාද වී තිබුණි. මේ අනුව ජාතික හා ජාත්‍යන්තර තරඟාවලි සඳහා සහභාගිවන ශ්‍රී ලංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තහනම් උත්තේජක චෝදනාවන්ට භාජනය වීමේ අවදානම අඩුකර පිවිතුරු ගුණයෙන් යුත් ක්‍රීඩාවක් ප්‍රවර්ධනය කිරීමේ මූලික පරමාර්ථ ඉටුකර ගැනීම ප්‍රමාද වී තිබුණි.

පිටුව 6 | 7

(ආ) අශ්වයින් සඳහා උත්තේජක පරීක්ෂණ සිදුකිරීම වෙනුවෙන් ක්‍රීඩා සංගමයකින් 2021 දෙසැම්බර් 31 දිනට රු 6,24,100 ක් අයවිය යුතුව පැවතුණි. එම අගයෙන් මාස 09 ක කාලයක සිට අයකර නොගත් රු.221,600 ක ශේෂයක් පැවතුණි.

(ඇ) නියෝජ්‍යායතනයේ 2021 වර්ෂය සඳහා අධ්‍යක්ෂ (බලාත්මක කිරීම් හා ක්‍රියාත්මක කිරීම් යන තනතුර නියෝජ්‍යායතන ආරම්භ කල 2014 වර්ෂයේ සිටම පුරප්පාඩුව පැවතුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන ඇතුලත්ව එහි කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලැබූ කරුණු පිළිබඳ කළමනාකාරීත්වයේ යෝජිත පියවර පහත පරිදි ඉදිරිපත් කරමු.

### වෙනත් කරුණු

#### 01 කරුණ

ශ්‍රී ලංකාවේ සිදු කරන උත්තේජක පරීක්ෂාවන් ජාත්‍යාන්තර මට්ටමින් පවත්වා ගැනීම මෙන්ම දේශීය ආයුර්වේද ඖෂධ හා ආහාර පාන වල් අන්තර්ගතය හා ඒවායේ තහනම් ද්‍රව්‍ය අඩංගු විය හැකිද යන්න සොයා බැලීමේ අරමුණු කොට නියෝජ්‍යායතනයේ පර්යේෂණ ඒකකයක් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රු. මිලියන 101 (බදු සහිත) මුදල රජයේ ඒකාබද්ධ අරමුදලින් වෙන් කර ගැනීමට සහ එම ප්‍රතිපාදන 2019 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන යටතේ ලබා දීමට 2018 සැප්තැම්බර් 18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදනය සිදු කරනු ලැබීමෙන් පසු 2020 මාර්තු 15 දින වන විට නියෝජ්‍යායතනය වෙත ලැබී තිබූ මෙම පර්යේෂණ උපකරණ 2020 අප්‍රේල් 05 දින වන විට ස්ථාපිත කල යුතුව පැවතුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ තුල නොනිමි ප්‍රාග්ධන වැඩ යටතේ රු.60,211,400 ක් වූ පිරිවැය ලෙෂ දක්වා තිබූ මෙම පර්යේෂණ උපකරණ භාවිතයට අවශ්‍ය පුහුණුවීම් හා පර්යේෂණ කටයුතු වලට අවශ්‍ය විශේෂඥ සේවා ලබා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් සහ උපකරණ නිවැරදිව ක්‍රියාත්මක වන බවට විශේෂඥ පරීක්ෂණ වාර්තා නොගැනීම හේතුවෙන් පර්යේෂණාගාරයේ කටයුතු ප්‍රමාද වී තිබුණි. මේ අනුව ජාතික හා ජාත්‍යාන්තර තරඟාවලි සඳහා සහභාගීවන ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තහනම් උත්තේජක චෝදනාවන්ට භාජනය වීමේ අවදානම අඩුකර පීව ගුණයෙන් යුත් ක්‍රීඩාවක් ප්‍රවර්ධනය කිරීමේ මූලික පරමාර්ථ ඉටුකර ගැනීම ප්‍රමාද වී තිබුණි.

#### කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පර්යේෂණ විද්‍යාගාරයට මිලදී ගත් උපකරණ අතුරින් රු.මි. 60,211,400 ක් වූ LC- MS/MS (SHIMUDZU-8050) යන උපකරණය පමණක් භාවිතා කිරීමට නොහැකි (නොනිමි) මට්ටමේ පවතී. ඊට හේතුව එම උපකරණයේ ක්‍රියාකාරීත්වය පෙන්වා

දීමේ පරීක්ෂණය (PQ- test) හා එය භාවිතා කිරීමට අවශ්‍ය තාක්ෂණික පුහුණුව එම උපකරණයේ ශ්‍රී ලාංකික නියෝජිත ආයතනය වන හේලීස් ආයතනයට ගිවිසුම ප්‍රකාරව තවමත් අවසාන කිරීමට නොහැකිවීම ය. මෙම කාර්යන් දෙක SHIMUDZU ආයතනයේ විශේෂඥයෙකු (SAP) මඟින් අවසාන කිරීමට නියමිතව තිබුනේ 2020 වර්ෂයේ මාර්තු 15 වැනි දින දීය. නමුත් 2020 මාර්තු වන විට උද්ගතවූ ගෝලීය කොරෝනා වසංගත තත්වය නිසා සිංගප්පූරුවේ සිට SAP ගේ පැමිණීම ප්‍රමාද කිරීමට සිදුවිය.

ඊට විසඳුමක් ලෙස හේලීස් ආයතනයේ සේවක කණ්ඩායමක් විසින් SAP ව මාර්ග ගත (Online) තාක්ෂණය ඔස්සේ සම්බන්ධ කර ගනිමින් පුහුණු කටයුතු ආරම්භ කලේය. නමුත් එම විශ්ලේශණ අතරතුරේ දී එක් රසායනයකට (exemestane) උපකරණය ලබා දෙන ප්‍රතිචාරය පිළිගත නොහැකි මට්ටමක පැවති නිසා හේලීස් ආයතනය පුහුණු කටයුතු නතර කොට SAP ගේ උපදෙස් වලට අනුව උපකරණයේ ගැටළුව විසඳීමේ කාර්යය ආරම්භ කරන ලදී.

2021 අවසාන භාගය වන විට ශ්‍රී ලංකාව හා සිංගප්පූරුව අතර පැවති කොවිඩ් සංචරණ බාධා ලිහිල් වූ බැවින් SAP ලංකාවට ගෙන්වා දෙන ලෙසට අප ආයතනය වරින් වර හේලීස් ආයතනයට බල කරන ලදී. නමුත් SAP ලංකාවට පැමිණීම දිගටම ප්‍රමාද කල නිසා දෙවැනි වරට ද හේලීස් නියෝජිත පිරිස සමඟ PQ-test හා පුහුණු කටයුතු නොවැම්බර් මස ආරම්භ කරන ලදී. එවිට ද මුල් අවස්තාවේ ඇති වූ ගැටළුව නැවත වරක් උපකරණයේ මතු වූ අතර හේලීස් ආයතනය විසින් ගැටළු විසඳීමේ කාර්යය ආරම්භ කරන ලදී.

මේ හේතුව නිසා 2021 දෙසැම්බර් වන විටත් LC-MS/MS උපකරණය භාවිතා කිරීමට නොහැකි විය. මෙම උපකරණයේ ක්‍රියාකාරීත්වය නිසි පරිදි පෙන්වා දෙන තුරු උපකරණය ආයතනයට භාර ගැනීමක් හෝ වගකීම් කාලය (warranty period) ආරම්භ කිරීමක් හෝ ඉතිරි මුදල් ගෙවීමක් හෝ නොකිරීමට අප ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

### 2022 අගෝස්තු වන විට එහි නවතම තත්වය

SAP ලංකාවට පැමිණ තම විශේෂඥ දැනුම භාවිතා කර උපකරණයේ ඇති වී ඇති ගැටළුව විසඳීමේ වැදගත්කම අප ආයතනය මඟින් වරින් වර පෙන්වා දුන්නද 2022 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පවතින අර්බුදකාරී තත්වයන් හේතුවෙන් තමාට ඉක්මනින් ලංකාවට පැමිණිය නොහැකි බව ඔහු විසින් දන්වන ලදී. මේ හේතුව නිසා 2022 ජුලි 25 වැනි දින තෙවැනි වරට ද හේලීස් සමාගමේ නියෝජිතයින් සමඟ PQ-test හා පුහුණු කටයුතු නැවත ආරම්භ කල ද පෙර පැවති ගැටළුව එලෙසම මතු විය. මේ නිසා හේලීස් ආයතනයට විරුද්ධව නීතිමය ක්‍රියා මාර්ග වලට එළඹීමට අගෝස්තු මාසයේ දී අප ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පියවර ගන්නා ලදී.

## 02 කරුණ

අශ්වයින් සඳහා උත්තේජක පරීක්ෂණ සිදු කිරීම වෙනුවෙන් ක්‍රීඩා සංගමයකින් 2021 දෙසැම්බර් 31 දිනට රු.624,100 ක් අයවිය යුතුව පැවතුණි. එම අගයෙන් මාස 09 ක කාලයක සිට අය කර නොගත් රු.221,600 ක ශේෂයක් පැවතුණි.

**කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම**

Turf Club වෙතින් අයවිය යුතු මුදල් ලබා ගැනීම සඳහා එම ආයතනය කිහිප අවස්තාවකදීම දැනුවත් කිරීම සිදුකල අතර අදාල ආදායම් එකතු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

## 03 කරුණ

නියෝජ්‍යායතනයේ 2021 වර්ෂය සඳහා අධ්‍යක්ෂ (බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම්) තනතුර නියෝජ්‍යායතනය ආරම්භ කල 2014 වර්ෂයේ සිටම පුරප්පාඩුව පැවතුණි.

**කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම**

අධ්‍යක්ෂ (බලාත්මක කිරීම් හා ක්‍රියාත්මක කිරීම්) තනතුරට බඳවා ගැනීම සඳහා අවස්ථා කිහිපයකදීම ප්‍රසිද්ධ පුවත්පත්වල දැන්වීම් පලකල අතර සුදුසු අයදුම්කරුවකු ඉදිරිපත් නොවූ අතර එම තනතුර දැනට පුරප්පාඩුව පවතී. මේ වන විට ඒ සඳහා සුදුසුකම් සහිත ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරට නොඅඩු නිලධාරියෙකු ද්විතීයන පදනම මත බඳවාගැනීම සඳහා අපගේ රේඛීය අමාත්‍යාංශය මගින් ශ්‍රී ලංකා පොලිසිය වෙත ඉල්ලීමක් සිදුකර ඇත.

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report

## -2021-

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය
இலங்கை ஊக்குமருந்து பயன்பாட்டிற்கெதிரான முகவராண்மை
**SRI LANKA ANTI-DOPING AGENCY**

363/12, සුගතදාස ස්ටේඩියම්-බ්ලෝක් ඩී, ක්‍රීඩා සංකීර්ණ රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.
363/12, சுகததாச விளையாட்டரங்கு-ப்ளொக் டி, ஸ்டேடியம் பார்க்கிங் ரோட்,
சிறிமாவோ பண்டாரநாயக்க மாவத்தை, கொழும்பு 14.
No 363/12, Sugathadasa Stadium-Block D, Stadium Parking Road, Sirimavo Bandaranaike Mawatha, Colombo 14.
Tel: 011 3071 838 / 011 2328 366 Email: sladasl@yahoo.com Website: www.antidopingsrilanka.org